
# එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය

## UNITED NATIONS CHARTER (SINHALA)



# එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය

## මූලාරම්භය

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සකස් කරන ලද්දේ 1945 අප්‍රේල් මස 25 වැනි දින පටන් ජුනි මස 26 වැනි දින දක්වා සැන් ෆ්‍රැන්සිස්කෝ නගරයේ පැවැත්වුණු අන්තර් ජාතික සංවිධානය පිහිටුවීමේ එක්සත් ජාතීන්ගේ සම්මේලනයට සහභාගි වූ ජාතීන් 50 ක නියෝජිතයින් විසිනි. 1944 කාරක සභාවන්ගෙන් එකකට හෝ ඒකාබද්ධ කාරක සභාවකට හෝ අගෝස්තු - ඔක්තෝබර් අතර කාලය තුළ ඩම්බර්ටන් ඕක්ස්හි රැස් වූ (ජාතික) චීනය, සෝවියට් සංගමය, බ්‍රිතාන්‍යය, හා ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල නියෝජිතයින් විසින් සකස් කරන ලද මූලික යෝජනා අනුව නියෝජිතයෝ මේ ප්‍රඥප්තිය පිළියෙල කළහ. මේ ප්‍රඥප්තිය 1945 ජුනි මස 26 වැනි දින අත්සන් තැබීමෙන් පිළිගන්නා ලදී. පෝලන්තය සම්මේලනයට සහභාගි නොවූවද පසුව මේ ප්‍රඥප්තිය පිළිගනිමින් අත්සන් තබා සංවිධානයේ මුල් සාමාජික රටවල් 51 ට ඇතුළත් විය. 1945 ඔක්තෝබර් මස 24 වැනි දින චීනය, ප්‍රංශය, සෝවියට් සංගමය, එක්සත් රාජධානිය සහ එක්සත් ජනපදය විසින් ද වෙනත් රටවල් වැඩි ගණනක් විසින් ද ප්‍රඥප්තිය අනුමත කිරීමෙන් පසු නිල වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ විය.

**එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ජාතීන් වන අපි**

අපගේ ජීවිත කාලපරිච්ඡේදය තුළ දෙවරක් මුළු මහත් මනුෂ්‍ය සංහතියටම අප්‍රමාණ දුක් වේදනා ළඟා කළ යුද්ධෝපද්‍රවයෙන් අනාගත පරම්පරාවන් මුදවාලීමට ද,

මූලික මිනිස් අයිතිවාසිකම් කෙරෙහිත්, මනුෂ්‍යාත්මභාවයේ ගරුත්වය හා වටිනාකම කෙරෙහිත්, ස්ත්‍රී පුරුෂ සියලු දෙනාගේ හා ලොකු කුඩා සියලු ජාතීන්ගේ සමාන අයිතිවාසිකම් කෙරෙහිත්, විශ්වාසය නැවත තහවුරු කිරීමට ද,



2 - CM 4361

ගිවිසුම් හා ජාත්‍යන්තර නීතිගත වෙනත් ලියවිලිවලින් උද්ගත වන යුතුකම්වලට ගරු කිරීමට හා ඒ යුතුකම් සාධාරණ ලෙස ඉෂ්ට වීමට තුඩුදෙන කොන්දේසි පිහිටුවාලීමට ද,

වඩා පුළුල් නිදහසක් ඇති පරිසරයක සමාජ ප්‍රගතිය සඳහා ක්‍රියා කිරීමට හා ජීවන තත්ත්වයන් උසස් කිරීමට ද අධිෂ්ඨාන කරගෙන,

යථොක්ත පරමාර්ථ සාධනය අරභයා ඉවසීමෙන් යුක්තව හොඳ අසල්වැසියන් ලෙස අන්‍යෝන්‍ය සමගියෙන් එකට ජීවත් වීමටත්,

ජාත්‍යන්තර සාමයත් ආරක්ෂාවත් සලසාගැනීමට අපේ ශක්තිය ඒකයෝගී කිරීමටත්,

ප්‍රතිපත්ති පිළිගැනීමෙන් හා සම්ප්‍රදායයන් පිහිටුවීමෙන් පොදු ශුභසිද්ධිය උදෙසා කටයුතු කිරීමට මිස අන් කිසිම කරුණක් සඳහා යුද්ධ බලය පාවිච්චි නොකිරීමටත්,

සියලුම ජනතාවන්ගේ ආර්ථික හා සාමාජයීය ප්‍රගතිය උච්චස්ථානයට පමුණුවාලීම සඳහා ජාත්‍යන්තර කාර්ය පරිපාටියක් ඇති කිරීමටත්,

ඒ අරමුණු මුදුන්පත් කරලීම සඳහා අපේ ප්‍රයත්නයන් සම්බන්ධ කරලීමට අධිෂ්ඨාන කර ගනිමු. මේ තීරණ අනුව, සැන් ප්‍රැන්සිස්කෝ නගරයට එක් රැස් වූ නියෝජිතයන්ගේ මාර්ගයෙන් ස්වකීය සම්පූර්ණ බලතල යථා ස්වරූපයෙන් විදහා දැක් වූ අපේ ඒ ඒ ආණ්ඩු එක්සත් ජාතීන්ගේ මේ ප්‍රඥප්තියට එකඟ වූයෙන් එක්සත් ජාතීන් නමින් හැඳින්වෙන ජාත්‍යන්තර සංවිධානයක් මෙසේ පිහිටුවා ගනිමු.

# 1 වැනි පරිච්ඡේදය

# පරමාධ්‍යාශ හා ප්‍රතිපත්ති

## 1 වැනි වගන්තිය

### එක්සත් ජාතීන්ගේ පරමාධ්‍යාශයෝ නම්

1. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වාගැනීම හා ඒ සඳහා පහත සඳහන් කටයුතු කිරීම සාමයට ඇති තර්ජන වැළැක්වීම හා ඉවත් කිරීම ද ආක්‍රමණික ක්‍රියා හෝ සාමය බිඳී යාමට තුඩු දෙන වෙනත් ක්‍රියා මැඩපැවැත්වීම ද අරභයා සාමූහිකව ප්‍රබල විධිවිධාන යෙදීම හා සාමය බිඳී යා හැකි පරිද්දෙන් ඇතිවන ජාත්‍යන්තර වාද භේද හෝ ආරවුල් සමගි සමාදානයෙන් යුක්තව ද අධිකරණ ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර නීතියට අනුව ද සමථයකට පත් කිරීම හෝ බේරුම් කිරීම.

2. ජාතීන්ගේ සමාන අයිතිවාසිකම් හා ස්වෛරීභාවය පිළිබඳ ප්‍රතිපත්තිය කෙරෙහි ඇති ගෞරවය පදනම් කොට ගෙන ජාතීන් අතර සුහද සම්බන්ධතා වැඩි දියුණු කිරීම හා සමස්ත ලෝක සාමය තහවුරු කිරීමට වෙනත් සුදුසු විධිවිධාන යෙදීම.

3. ආර්ථික වූ හෝ සාමාජයීය වූ හෝ සංස්කෘතික වූ හෝ මානුෂවාදී ස්වභාවයකින් යුක්ත වූ හෝ ජාත්‍යන්තර ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා ද ජාති භේද, ස්ත්‍රී පුරුෂ භේද හෝ භාෂා භේද හෝ ආගම් භේද ගැන නොතකා සියලු දෙනාගේම මිනිස් අයිතිවාසිකම් කෙරෙහිත් මූලික ස්වාධීනතා කෙරෙහිත් ඇති ගෞරවය වඩාලීමට ධෛර්‍යය දීම සඳහා ද ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීම.

4. මේ පොදු පරමාර්ථ මුදුන් පමුණුවාලීම පිණිස විවිධ ජාතීන්ගේ කටයුතු එකමුතු කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම යන මේවා වෙති.

## 2 වැනි වගන්තිය

1. 1 වැනි වගන්තියේ සඳහන් පරමාධ්‍යාශයන් මුදුන්පත් කරවාගැනීම සඳහා මේ සංවිධානය ද සාමාජික රටවල් ද පහත සඳහන් ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

2. සාමාජිකත්වයෙන් ලැබෙන අයිතිවාසිකම් හා ඵල ප්‍රයෝජන භුක්ති විඳීම පිණිස සියලුම සාමාජික රටවල් මේ ප්‍රඥප්තියට අනුව තම තමන් කෙරෙහි පැවරෙන වගකීම් අවංකවම ඉෂ්ට කළ යුතුය.

3. ජාත්‍යන්තර සාමයට හා ආරක්ෂාවට ද යුක්ති ධර්මයට ද හානියක් නොවන ලෙසට හැම සාමාජික රටක් ම තම තමන්ගේ ජාත්‍යන්තර ආරවුල් සමගි සමාදානයෙන් බේරුම් කර ගත යුතුය.

4. ස්වකීය ජාත්‍යන්තර සම්බන්ධතාවල දී සියලු සාමාජික රටවල් කවර රාජ්‍යයක හෝ භෞමික අඛණ්ඩතාවට හෝ ඒ ඒ රාජ්‍යයේ දේශපාලන නිදහසට හෝ විරුද්ධව යුද බලය පාවිච්චි කිරීමෙන් හෝ පාවිච්චි කිරීමට තර්ජනය කිරීමෙන් හෝ එක්සත් ජාතීන්ගේ පරමාධ්‍යාශවලට පටහැනි වෙන යම් කිසිවක් කිරීමෙන් හෝ වැළකී සිටිය යුතුය.

5. මේ ප්‍රඥප්තිය අනුව එක්සත් ජාතීන් ගන්නා ඕනෑම ක්‍රියාමාර්ගයකට සියලුම සාමාජික රටවල් හැකි සෑම උපකාරයක්ම දිය යුතුය. එසේ ම එක්සත් ජාතීන් විසින් යුද්ධය වැළැක්වීමේ හෝ බලය යෙදවීමේ හෝ ක්‍රියාමාර්ගයක් යම් රාජ්‍යයකට විරුද්ධව ගෙන යන්නේ නම් එවැනි කවර රාජ්‍යයනට වත් උපකාර කිරීමෙන් වැළකී සිටිය යුතුය.

6. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමට අවශ්‍යවන තරමට එක්සත් ජාතීන්ගේ සාමාජිකයන් නොවූ රටවල කටයුතු ද මේ ප්‍රතිපත්ති අනුව හැඩගැස්වීමට සංවිධානය වගබලා ගත යුතුය.

7. කවර රටක වුවත් අභ්‍යන්තර පාලනයට අත්‍යර්ථයෙන්ම ඇතුළත් වන්නා වූ කටයුතුවලට මැදිහත්වීමට එක්සත් ජාතීන්ට බලය ලැබී ඇත්තේ ය කියා හෝ සාමාජික රටවල් මගින් එවැනි කටයුතු බේරුම් කරගැනීමට මේ ප්‍රඥප්තිය යටතේ මේ සංවිධානයට ඉදිරිපත් කළ යුතුය කියා හෝ මේ ප්‍රඥප්තියේ සඳහන් කිසිවකින් තේරුම් නො ගත යුතුය. එහෙත් යුද්ධ බලය යෙදවීම පිළිබඳ 8 වැනි පරිච්ඡේදය යටතේ වූ විධිවිධාන යෙදවීම සම්බන්ධයෙන් මේ ප්‍රතිපත්ති බාධකයක් නොවිය යුතුය.

## II වැනි පරිච්ඡේදය

# සාමාජිකත්වය

### 3 වැනි වගන්තිය

ජාත්‍යන්තර බලමණ්ඩලයක් වශයෙන් සංවිධානය වීම සඳහා සැන් ප්‍රැන්සිස්කෝ නගරයේ දී පැවැත්වූ එක්සත් ජාතීන්ගේ සම්මේලනයට සහභාගි වී හෝ 1942 ජනවාරි මස 1 වැනි දින දරන එක්සත් ජාතීන්ගේ ප්‍රකාශයට කලින් අත්සන් කොට හෝ මේ ප්‍රඥප්තිය අත්සන් කොට 110 වැනි වගන්තිය අනුව එය ස්ථිර කර ගන්නා වූ රාජ්‍යයෝ එක්සත් ජාතීන්ගේ මුල් සාමාජිකයෝ විය යුත්තාහ.

### 4 වැනි වගන්තිය

1. මේ ප්‍රඥප්තියේ සඳහන් යුතුකම් පිළිගන්නා වූ ද සංවිධානයේ නිගමනයේ හැටියට, මේ යුතුකම් ඉෂ්ට කිරීමට තරම් ශක්තියක් ඇතිව එසේ කටයුතු කිරීමට කැමති වන්නා වූ ද සාමකාමී සෙසු සියලු රටවලටත් එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය විවෘතව ඇත.

2. එබඳු රාජ්‍යයක් එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වයට බඳවා ගත යුත්තේ ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය පිට මහා මණ්ඩලය විසින් කරනු ලබන තීරණයකිනි.

### 5 වැනි වගන්තිය

ආරක්ෂක මණ්ඩලය මගින් යුද්ධය වැළැක්වීමේ හෝ යුද්ධ බලය යෙදවීමේ හෝ ක්‍රියාමාර්ගයක් එක්සත් ජාතීන්ගේ යම් සාමාජික රටකට විරුද්ධව ගෙන යන ලද්දේ නම් ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය පිට ඒ රටේ සාමාජිකත්වය පිළිබඳ අයිතිවාසිකම් හා වරප්‍රසාද ක්‍රියාවෙහි යෙදවීම කලකට තහනම් කිරීමට මහා මණ්ඩලයට බලය ඇත්තේය. මේ බලතල හා වරප්‍රසාද පිළිබඳ අයිතිය නැවත ඒ සාමාජික රටට ලබාදීමට ආරක්ෂක සභාවට බලය තිබේ.

### 6 වැනි වගන්තිය

මේ ප්‍රඥප්තියේ දැක්වෙන ප්‍රතිපත්ති නැවත නැවතත් උල්ලංඝනය කරන ඕනෑම සාමාජික රටක් ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය පිට එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් නෙරපා දැමීමට මහා මණ්ඩලයට බලය ඇත්තේය.

## III වැනි පරිච්ඡේදය

# සංස්ථාවෝ

**7 වැනි වගන්තිය**

1. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන සංස්ථාවන් වශයෙන් මහා මණ්ඩලය, ආරක්ෂක මණ්ඩලය, ආර්ථික හා සාමාජයීය මණ්ඩලය, භාරකාරත්ව මණ්ඩලය, ජාත්‍යන්තර අධිකරණය, ලේකම් කාර්යාංශය යන මේවා පිහිටුවා ඇත්තේය.

2. වෙනත් අප්‍රධාන සංස්ථාවන් පිහිටුවීමට වුවමනා නම් මේ ප්‍රඥප්තිය අනුව එවැනි අප්‍රධාන සංස්ථාවන් පිහිටුවිය හැකිය.

**8 වැනි වගන්තිය**

ස්වකීය ප්‍රධාන සංස්ථාවල හා අප්‍රධාන සංස්ථාවල ඕනෑම ධුරයක පුරුෂයින්ට මෙන්ම ස්ත්‍රීන්ටත් එක සමාන අයිතිවාසිකම් ඇතිව කටයුතු කිරීමට ඇති සුදුසුකමට එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් කිසිම බාධාවක් ඇති නොවිය යුතුය.

## IV වැනි පරිච්ඡේදය

## මහා මණ්ඩලය

### 9 වැනි වගන්තිය

1. එක්සත් ජාතීන්ට අයත් සියලුම සාමාජික රටවල් මහා මණ්ඩලයේ සාමාජිකයෝ විය යුත්තාහ.

2. එක් සාමාජික රටක් වෙනුවෙන් නියෝජිතයන් පස් දෙනකුට වැඩි ගණනක් මහා මණ්ඩලයෙහි නො සිටිය යුතුය.

## කර්තව්‍යයන් හා බලතල

### 10 වැනි වගන්තිය

මේ ප්‍රඥප්තියේ විෂය මාලාවට ඇතුළත් වන්නාවූ හෝ මේ ප්‍රඥප්තියේ ප්‍රකාර පිහිටුවා ඇති ඕනෑම සංස්ථාවක බලතල හා කටයුතු සම්බන්ධයෙන් වූ හෝ ප්‍රශ්න නොහොත් කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමටත්, 12 වැනි වගන්තියෙන් විධිවිධාන සලස්වා තිබෙන ප්‍රකාරයට හැර එක්සත් ජාතීන්ගේ සාමාජික රටවලට හෝ ආරක්ෂක මණ්ඩලයට හෝ ඒ දෙපාර්ශවයටම හෝ එබඳු ඕනෑම ප්‍රශ්නයක් නොහොත් කරුණක් සම්බන්ධයෙන් නිර්දේශ කිරීමටත් මහා මණ්ඩලයට බලය ඇත්තේය.

### 11 වැනි වගන්තිය

1. නිරායුධකරණය හා යුද්ධෝපකරණ පරිහරණය විධිමත් කිරීම සම්බන්ධයෙන් බලපාන ප්‍රතිපත්ති ද ඇතුළුව ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමට සහයෝගීව ක්‍රියාකිරීම පිළිබඳ පොදු ප්‍රතිපත්ති ගැන සලකා බැලීමටත් රටවලට හෝ ආරක්ෂක මණ්ඩලයට හෝ ඒ දෙපාර්ශවයටම හෝ එකී ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ කිරීමටත් මහා මණ්ඩලයට බලය ඇත්තේය.

2. එක්සත් ජාතීන්ගේ යම් සාමාජික රටකින් හෝ ආරක්ෂක මණ්ඩලයෙන් හෝ 35 වැනි වගන්තියේ 2 වැනි ඡේදයේ ප්‍රකාර එක්සත් ජාතීන්ගේ සාමාජිකයෙකු නොවූ රාජ්‍යයකින් හෝ ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම පිළිබඳව මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ප්‍රශ්න සාකච්ඡා කිරීමටත් 12 වැනි වගන්තියෙන් විධිවිධාන සලස්වා තිබෙන ප්‍රකාරයට හැර ඒ රාජ්‍යයට නොහොත් රාජ්‍යවලට හෝ

ආරක්ෂක මණ්ඩලයට හෝ ඒ දෙපාර්ශවයටම හෝ එබඳු ඕනෑම ප්‍රශ්නයක් සම්බන්ධයෙන් නිර්දේශ කිරීමටත් මහා මණ්ඩලයට බලය ඇත්තේ ය. යම් ප්‍රශ්නයක් ගැන ක්‍රියාකිරීමට අවශ්‍ය වන්නේ නම් සාකච්ඡා කිරීමට කලින් හෝ සාකච්ඡා කිරීමෙන් පසු ව හෝ මහා මණ්ඩලය විසින් ඒ ප්‍රශ්නය ආරක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

3. ජාත්‍යන්තර සාමයට හා ආරක්ෂාවට හානි සිදුවිය හැකි අන්දමේ අවස්ථා ඇතිවුවහොත් මහා මණ්ඩලය විසින් ඒ ගැන ආරක්ෂක මණ්ඩලයේ අවධානය යොමු කරවිය යුතුය.

4. මේ වගන්තියෙන් දක්වා ඇති මහා මණ්ඩලයේ බලතලවලින් 10 වැනි වගන්තියේ සඳහන් පොදු ස්වරූපය සීමා නොවිය යුතුය.

## 12 වැනි වගන්තිය

1. ආරක්ෂක මණ්ඩලය යම් වාදභේදයක් හෝ ආරවුලක් පිළිබඳව මේ ප්‍රඥප්තියෙන් පවරා ඇති කටයුතු ක්‍රියාවෙහි යොදවාගෙන යන අතරතුර දී ඒ වාද භේදය හෝ ආරවුල සම්බන්ධයෙන් යමක් නිර්දේශ කරන ලෙස ආරක්ෂක මණ්ඩලය විසින් මහා මණ්ඩලය වෙත ඉල්ලීමක් කරතොත් මිස නැත්නම් මහා මණ්ඩලය ඒ පිළිබඳව කිසිම නිර්දේශයක් නොකළ යුතුය.

2. ආරක්ෂක සභාවේ අනුමැතිය ඇතිව මහා ලේකම් විසින් ආරක්ෂක මණ්ඩලයෙන් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම සම්බන්ධයෙන් කෙරෙන කටයුතු මහා මණ්ඩලයේ එක් එක් රැස්වීම් වාරයේ දී මහා මණ්ඩලයට දැනුම් දිය යුතුය. එසේ ම ආරක්ෂක මණ්ඩලය ඒ කටයුතු පිළිබඳව ක්‍රියාකිරීම නැවැත්වූ වහාම ඒ බව මහා මණ්ඩලයට හෝ එහි සභා රැස්වීම් පවත්වාගෙන යනු නොලැබේ නම් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවලට දැනුම් දිය යුතුය.

## 13 වැනි වගන්තිය

1. මහා මණ්ඩලය විසින් -

(අ) දේශපාලන කටයුතු අතින් ජාත්‍යන්තර සහයෝගය වර්ධනය කිරීම හා සහයෝගය, නීතිය ක්‍රමයෙන් වැඩිදියුණු කොට ව්‍යවස්ථා සංග්‍රහයක් වශයෙන් පිළියෙළ කිරීමට අනුබල දීමත්;

(ආ) ආර්ථික, සාමාජයීය, සංස්කෘතික අධ්‍යාපනික හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර සහයෝගය වර්ධනය කිරීම හා ජාතිභේද හෝ ස්ත්‍රී පුරුෂ භේද හෝ භාෂා භේද ආගම් භේදයන් නොතකා සියලු දෙනාගේ ම මිනිස්, අයිතිවාසිකම් හා මූලික ස්වාධීනත්වය සාක්ෂාත් කිරීමට උපස්ථම්භක වීමත්,

අධ්‍යයන කටයුතු ඇරඹීමත්, නිර්දේශ කිරීමත් කළ යුතුය.

2. (1) (ආ) ඡේදයේ සඳහන් කාරණා සම්බන්ධයෙන් මහා මණ්ඩලයේ අවශේෂ වගකීම් කටයුතු හා බලතල 9 වැනි සහ 10 වැනි පරිච්ඡේදවල දක්වා ඇත්තේය.

**14 වැනි වගන්තිය**

එක්සත් ජාතීන්ගේ පරමාධ්‍යාශ හා ප්‍රතිපත්ති දැක්වෙන මේ ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමෙන් පැන නගින අවස්ථාවන් ද ඇතුලුව ජාතීන් අතර පොදු ශුභ සිද්ධියට හෝ සුහද සම්බන්ධතාවලට හෝ හානිවිය හැකි යයි සිතෙන ඕනෑම අවස්ථාවක එහි මූලාරම්භය ගැන නොසලකා ම සාමකාමීව බේරුම් කිරීම සඳහා 12 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව නිර්දේශ කිරීමට මහා මණ්ඩලයට බලය ඇත්තේය.

**15 වැනි වගන්තිය**

1. මහා මණ්ඩලයට විසින් ආරක්ෂක මණ්ඩලයෙන් ඉදිරිපත් කරන සාංවත්සරික වාර්තා හා විශේෂ වාර්තා භාරගෙන ඒවා තම සැලකිල්ලට භාජන කළ යුතුය. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා ආරක්ෂක මණ්ඩලයෙන් තීරණය කරන ලද්දා වූ හෝ ක්‍රියාවට නගන ලද්දා වූ හෝ විධිවිධාන පිළිබඳ විස්තරයක් මේ වාර්තාවල ඇතුළත් විය යුතුය.

2. මහා මණ්ඩලය විසින් එක්සත් ජාතීන්ගේ වෙනත් සංස්ථාවන් මගින් ඉදිරිපත් කරන වාර්තා භාරගෙන ඒවා තම සැලකිල්ලට භාජන කළ යුතුය.

**16 වැනි වගන්තිය**

යුද්ධෝපාය අතින් වැදගත් කොට නොසලකන්නා වූ ප්‍රදේශ වෙනුවෙන් භාරකාරත්ව ගිවිසුම අනුමත කිරීම ද ඇතුළුව XII වැනි හා XIII වැනි පරිච්ඡේදයන් යටතේ ජාත්‍යන්තර භාරකාරත්ව ක්‍රමය සම්බන්ධයෙන් තමන් වෙත පවරනු ලබන කර්තව්‍යයන් මහා මණ්ඩලය විසින් ඉෂ්ට කළ යුතුය.

**17 වැනි වගන්තිය**

1. මහා මණ්ඩලය විසින් සංවිධානයේ අයවැය ලේඛනය විභාග කොට අනුමත කළ යුතුය;

2. මහා මණ්ඩලයෙන් ඒ ඒ සාමාජික රටට බෙදා වෙන් කරන හැටියට සංවිධානයේ වියහියදම් සාමාජික රටවල් මගින් දැරිය යුතුය;

3. 57 වැනි වගන්තියෙන් සඳහන් විශේෂඥ මණ්ඩල සමග මුදල් හා අයවැය ලේඛන සම්බන්ධයෙන් යොදාගනු ලබන වැඩ පිළිවෙළවල් මහා මණ්ඩලය විසින් සළකා බලා අනුමත කළ යුතුය. එසේ ම ඒ ඒ මණ්ඩලවලට නිර්දේශයන් නිකුත් කිරීම සඳහා එකී විශේෂඥ මණ්ඩලවල පරිපාලනාත්මක අයවැය ලේඛන ද මහා මණ්ඩලවල පරිපාලනාත්මක අය වැය ලේඛන ද මහා මණ්ඩලය විසින් විභාග කළ යුතුය.

## ඡන්දය දීම

### 18 වැනි වගන්තිය

1. මහා මණ්ඩලයේ එක් සාමාජිකයකුට ඇත්තේ එක් ඡන්දයක් පමණකි.

2. මහා මණ්ඩලය විසින් වැදගත් ප්‍රශ්න තීරණය කළ යුත්තේ රැස්වීම් වාරයට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකොටසකගේ වැඩි ඡන්දයෙනි. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම පිළිබඳ නිර්දේශ, ආරක්ෂක මණ්ඩලයට අස්ථිර සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, ආර්ථික හා සමාජයීය මණ්ඩලයට සාමාජිකයින් තෝරා පත් කර ගැනීම, 86 වැනි වගන්තියේ 1 (උ) ඡේදය අනුව භාරකාරත්ව මණ්ඩලයට සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අලුත් සාමාජික රටවල් ඇතුළත් කරගැනීම, සාමාජිකත්වය පිළිබඳ අයිතිවාසිකම් හා වරප්‍රසාද අත්හිටුවීම, සාමාජිකත්වයෙන් රටවල් ඉවත්කර දැමීම, භාරකාරත්ව ක්‍රමය ක්‍රියාවේ යෙදවීම පිළිබඳ ගැටලු, අයවැය ලේඛන පිළිබඳ ගැටලු යන මේවා යථෝක්ත ප්‍රශ්නවලට ඇතුළත් විය යුත්තාහ.

3. තුනෙන් දෙපංගුවක වැඩි ඡන්දයෙන් තීරණය කළයුතු අතිරේක ප්‍රශ්න ගණයට වැටෙන ප්‍රශ්න කවරේදැයි තීරණය කිරීමත් ඇතුළුව වෙනත් ප්‍රශ්න තීරණය කළ යුත්තේ රැස්වීම් වාරයට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙනි.

### 19 වැනි වගන්තිය

1. එක්සත් ජාතීන්ගේ යම් සාමාජික රටකින් සංවිධානයට ගෙවිය යුතුව තිබෙන සාමාජික මුදල්වලින් හිඟ හිටවා ඇති මුදල පසුගිය දෙවර්ෂයම වෙනුවෙන් ඒ රටෙන් අයවිය යුතුව තිබුණා වූ සාමාජික මුදලට සමාන වේ නම් හෝ වැඩි වේ නම් හෝ මහා මණ්ඩලයේ කටයුතු පිළිබඳව ඒ රටට ඡන්දබලය නොතිබිය යුතුය. එසේකුදු වුවත්, සාමාජික මුදල් ගෙවීමට බැරි වූයේ ඒ සාමාජික රටෙහි ක්‍රියා ශක්තියට අවිෂය වූ හේතුන් නිසා බැව් මහා මණ්ඩලයට ඒත්තු ගියොත්, ඒ රටට ඡන්ද බලය පාවිච්චි කිරීමට ඉඩදීමට මහා මණ්ඩලයට බලය ඇත්තේය.

## කාර්‍ය සංවිධානය

### 20 වැනි වගන්තිය

මහා මණ්ඩලයේ සාංවත්සරික මහා සභාවාර නොකඩවාම නියමිත අවිසථාවේ දී ද විශේෂ සභාවාර වුවමනා වන හැටි හැටියට ද පැවැත්විය යුතුය. මහ ලේකම් විසින් ආරක්ෂක මණ්ඩලයේ හෝ එක්සත් ජාතීන්ගේ සාමාජිකයන්ගෙන් වැඩි දෙනකුගේ හෝ ඉල්ලීම පිට විශේෂ සභාවාර කැඳවිය යුතුය.

### 21 වැනි වගන්තිය

ස්වකීය කාර්‍ය සංවිධානය පිළිබඳ නීතිරීති මහා මණ්ඩලය විසින් සකස් කර ගත යුතුය. එක් එක් සභාවාරය උදෙසා මහා මණ්ඩලය විසින් සභාපතිවරයකු තෝරා පත්කර ගත යුතුය.

### 22 වැනි වගන්තිය

ස්වකීය කර්තව්‍යයන් ඉෂ්ට කිරීම සඳහා යම් යම් අප්‍රධාන සංස්ථාවන් පිහිටුවාලීම අවශ්‍ය යයි හැඟේ නම් එවැනි සංස්ථාවන් පිහිටුවා ගැනීමට මහ මණ්ඩලයට බලය ඇත්තේය.

## V වැනි පරිච්ඡේදය

# ආරක්ෂක මණ්ඩලය

## සංස්ථාපනය

### 23 වැනි වගන්තිය

1. ආරක්ෂක මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් පසළොසකින් සමන්විත විය යුතුය. චීන සමූහාණ්ඩුව, ප්‍රංශය, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය, මහා බ්‍රිතාන්‍ය හා උතුරු අයර්ලන්ත එක්සත් රාජ්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය යන මේ රටවල් ආරක්ෂක මණ්ඩලයේ ස්ථිර සාමාජිකයෝ විය යුත්තාහ. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම කෙරෙහිත්, සංවිධානයේ වෙනත් පරමාර්ථයන් කෙරෙහිත්, එක්සත් ජාතීන්ට අයත් විවිධ සාමාජික රටවලින් කෙරෙන සේවය ගැන පළමුකොට විශේෂයෙන් සලකා බලා මහා මණ්ඩලය විසින් ලෝකයේ එකම කොටසකට සීමා නො කොට නොයෙකුත් කොටස්වලින් ආරක්ෂක සභාවේ අස්ථිර සාමාජිකයන් වශයෙන් එක්සත් ජාතීන්ට අයිති තවත් රටවල් දහයක් තෝරා ගත යුතුය.

2. ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය නොවන සාමාජිකයන් තෝරා පත්කර ගත යුත්තේ දෑවුරුදු කාල පරිච්ඡේදයකටය. එතෙකුදු වුවත් මුලින් වතාවට අස්ථිර සාමාජිකයන් තෝරා පත්කර ගනු ලබන විට තිදෙනකු තෝරා ගත යුත්තේ එක් අවුරුදු කාලපරිච්ඡේදයකටය. ආරක්ෂක සභාවේ අස්ථිර සාමාජික සංඛ්‍යාව 11න් 15ට වැඩිවීමෙන් පසු ඒ අතරේ සාමාජිකයන් 4න් 2ක් තෝරාගත යුත්තේ එක් අවුරුදු කාලසීමාවකටය. මේ සාමාජිකත්වයෙන් අස්වී යන සාමාජිකයකු ඒ එක්කම ඊළඟ වාරයේදීත් තෝරා පත්කර ගනු ලැබීමට සුදුසුකම් නැත්තේය.

3. ආරක්ෂක මණ්ඩලයේ එක් එක් සාමාජික රට වෙනුවෙන් සිටිය යුත්තේ එක් නියෝජිතයකු පමණකි.

## කර්තව්‍යයන් හා බලතල

### 24 වැනි වගන්තිය

1. එක්සත් ජාතීන්ගේ කටයුතු කලට වේලාවටත්, හොඳටත්, ඉෂ්ට කරවීම පිණිස එහි සාමාජික ජාතීන් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමේ මූලික

වගකීම ආරක්ෂක මණ්ඩලය කෙරෙහි පවරති. එමෙන් ම මේ වගකීම පිට තම යුතුකම් ඉටුකිරීමේ දී ආරක්ෂක මණ්ඩලය ක්‍රියා කරන්නේ එක්සත් ජාතීන් වෙනුවෙන් බව පිළිගැනීමට ද ඒ සාමාජික රටවල් එකඟ වෙති.

2. මේ යුතුකම් ඉෂ්ට කිරීමේ දී ආරක්ෂක මණ්ඩලය විසින් එක්සත් ජාතීන්ගේ පරමාධ්‍යාශ හා ප්‍රතිපත්ති අනුව ක්‍රියා කළ යුතුය. මේ යුතුකම් ඉෂ්ටකිරීම සඳහා ආරක්ෂක මණ්ඩලය කෙරෙහි පවරා ඇති නියමිත බලතල VI වැනි VII, VIII වැනි හා XII වැනි පරිච්ඡේදවල දක්වා ඇත.

3. මහා මණ්ඩලයේ සැළකිල්ලට භාජන කරවීම පිණිස ආරක්ෂක මණ්ඩලය විසින් ස්වකීය සාංවත්සරික වාර්තා ද වුවමනා වුවහොත් විශේෂ වාර්තා ද ඉදිරිපත් කළ යුතුය.

**25 වැනි වගන්තිය**

මේ ප්‍රඥප්තිය අනුව ආරක්ෂක මණ්ඩලයේ තීරණ භාරගෙන ක්‍රියාවේ යෙදවීමට එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් එකඟ වෙති.

**26 වැනි වගන්තිය**

යුද්ධෝපකරණ සම්පාදනය වෙනුවෙන් ලෝකයේ මිනිස් බලය හා ධනය හැකිතාක් අඩුවෙන් යොදවා ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව ඇති කිරීමත්, පවත්වා ගැනීමත් අරභයා 47 වැනි වගන්තියේ සඳහන් යුධාධිකාරී කාරක සභාවේ උපකාර ද ඇතිව, යුද්ධෝපකරණ සීමාකිරීමේ ක්‍රමයක් පිහිටුවීම සඳහා එක්සත් ජාතීන්ගේ සාමාජිකයිනට ඉදිරිපත් කළ යුතු යෝජනා ක්‍රම සකස් කිරීම ද ආරක්ෂක මණ්ඩලයේ වගකීමකි.

## ඡන්දය දීම

**27 වැනි වගන්තිය**

1. ආරක්ෂක මණ්ඩලයේ එක සාමාජිකයකුට ඇත්තේ එක ඡන්දයක් පමණකි.

2. ආරක්ෂක මණ්ඩලය විසින් කාර්‍ය්‍ය සංවිධානාත්මක කරුණු තීරණය කළ යුත්තේ සාමාජිකයන් නව දෙනකු පක්ෂව දෙන ඡන්දයෙනි.

3. ආරක්ෂක මණ්ඩලය විසින් සෙසු සියලුම කරුණු තීරණය කළ යුත්තේ ස්ථිර සාමාජිකයන්ගේ සම්මත ඡන්ද ද ඇතුලුව සාමාජිකයන් නව දෙනෙකු ගේ පක්ෂ ඡන්දයෙනි. එතෙකුදු වුවත් VI වැනි ඡේදය යටතේ කෙරෙන තීරණවල දී ආරවුලකට සම්බන්ධව සිටින සාමාජිකයන් ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුය.



5 - CM 4361

## කාර්ය සංවිධානය

**28 වැනි වගන්තිය**

1. ආරක්ෂක මණ්ඩලය සංවිධානය විය යුත්තේ ස්වකීය කටයුතු නොකඩවාම කරගෙන යා හැකි පරිද්දෙනි. මේ සඳහා ආරක්ෂක මණ්ඩලයේ එක් එක් සාමාජිකයා වෙනුවෙන් නියෝජිතයෙකු නිතරම සංවිධාන මූලස්ථානයෙහි සිටිය යුතුය.

2. ආරක්ෂක මණ්ඩලය විසින් එහි රැස්වීම් කලින් කල පැවැත්විය යුතුය. ඒ ඒ සාමාජික රට කැමති නම්, මේ රැස්වීම්වලට එක් එක් සාමාජික රට වෙනුවෙන් ඒ රටේ ආණ්ඩුවේ සාමාජිකයකු හෝ විශේෂයෙන් පත්කරන ද නියෝජිතයෙකු හෝ එවිය හැකිය.

3. සංවිධාන මූලස්ථානයෙහි හැර වෙන යම් යම් ස්ථානවල දී ස්වකීය සභා රැස්වීම් . පැවැත්වීම ආරක්ෂක මණ්ඩලයේ කටයුතු සඳහා වඩාත් පහසු බැව් හැඟේ නම් ආරක්ෂක මණ්ඩලයට ඒ රැස්වීම් ඒ ඒ ස්ථානවල දී පැවැත්වීමට බලය ඇත්තේය.

**29 වැනි වගන්තිය**

ස්වකීය කර්තව්‍යයන් ඉෂ්ට කිරීම සඳහා යම් යම් අප්‍රධාන සංස්ථාවන් පිහිටුවාලීම අවශ්‍යයයි හැඟේ නම් එවැනි සංස්ථාවන් පිහිටුවා ගැනීමට ආරක්ෂක මණ්ඩලයට බලය ඇත්තේ ය.

**30 වැනි වගන්තිය**

සභාපති තෝරා පත් ගැනීමේ ක්‍රමය ද ඇතුළුව, ස්වකීය කාර්ය සංවිධානය පිළිබඳ නීතිරීති ආරක්ෂක මණ්ඩලය විසින් ම සකස් කර ගත යුතුය.

**31 වැනි වගන්තිය**

ආරක්ෂක සභාවේ ඉදිරියට පමුණුවන ලද යම් ප්‍රශ්නයක් පිළිබඳව කෙරෙන සාකච්ඡාවක් ආරක්ෂක සභාවේ සාමාජිකයෙකු නොවූ එක්සත් ජාතීන්ගේ යම්කිසි සාමජික රටක අයිතිවාසිකම්වලට විශේෂ වශයෙන් බලපාන බැව් ආරක්ෂක මණ්ඩලයට හැඟී යන කවර විටෙක දී වුවත් එකී සාමාජික රටට ඡන්ද බලයක් නැතිව ඒ සාකච්ඡාවට සහභාගි වීමට පුළුවන.

## 32 වැනි වගන්තිය

ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු නොවූ එක්සත් ජාතීන්ගේ ඕනෑම සාමාජික රටක් හෝ එක්සත් ජාතීන්ගේ සාමාජිකයකු නොවූ ඕනෑම රටක් හෝ ආරක්ෂක මණ්ඩලයේ සැළකිල්ලට භාජනව පවත්නා ආරවුලක් පාර්ශ්වකාරයකු වේ නම් ඒ ආරාවුල පිළිබඳ සාකච්ඡාවට ඡන්ද බලයක් නැතිව සහභාගි වන ලෙස එකී රටට ආරාධනය කළ යුතුය. එක්සත් ජාතීන්ගේ සාමාජිකයෙකු නොවූ රටක් සහභාගි කරවාගැනීම සම්බන්ධයෙන් යම් යම් කොන්දේසි පැනවීම යුක්ති යුක්ත බැව් හැගෙතොත් ආරක්ෂක මණ්ඩලය විසින් එවැනි කොන්දේසි පැනවිය යුතුය.

## VI වැනි පරිච්ඡේදය

# ආරාවුල් සාමදානයෙන් බේරුම් කිරීම

**33 වැනි වගන්තිය**

1. යම්කිසි ආරාවුලක් දිගටම එසේ තිබෙන්නට ඉඩ හැරීමෙන් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමට හානි සිදුවිය හැකි වේ නම්, ඒ ආරාවුලට සම්බන්ධ වූ පාර්ශ්වකාරයින් විසින් ඒ ගැන සාකච්ඡා පැවැත්වීමෙන් හෝ විභාග කිරීමෙන් හෝ මැදහත්ව කටයුතු කිරීමෙන් හෝ සමාදාන බේරුමකට බැසීමෙන් හෝ විනිශ්චයකාරයකුගේ තීරණයක් පිළිගැනීමෙන් හෝ අධිකරණයෙන් බේරුමක් කර ගැනීමෙන් හෝ ප්‍රාදේශීය නියෝජ්‍ය මණ්ඩල හෝ වැඩ පිළිවෙළවල් පිටිවහල් කරගැනීමෙන් හෝ තම තමන් තෝරා ගන්නා වෙනත් සාමකාමී ක්‍රමවලින් හෝ පළමුකොට ඒ ආරාවුල විසඳාගැනීමට උත්සාහ ගත යුතුය.

2. අවශ්‍යයයි හැගේ නම්, ආරක්ෂක මණ්ඩලය විසින් ඒ ඒ ආරාවුලට සම්බන්ධව සිටින පක්ෂවලට ස්වකීය ආරාවුල් එබඳු ක්‍රමයකින් බේරුම් කර ගන්නා ලෙස නියම කළ යුතුය.

**34 වැනි වගන්තිය**

1. යම්කිසි ආරාවුලක් හෝ ජාත්‍යන්තර ඝට්ටනයක් නොහොත් ආරාවුලක් පැන නැගීමට තුඩු දිය හැක්කා වූ තත්ත්වයක් හෝ දිගටම එසේ තිබෙන්නට ඉඩ හැරීමෙන් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වාගැනීමේ ප්‍රතිපත්තියට හානි සිදුවේ ද නැද්ද යන බව තීරණය කර ගැනීම පිණිස ඒ ආරාවුල නොහොත් තත්ත්වය ගැන විමර්ශනය කිරීමට ආරක්ෂක මණ්ඩලයට බලය ඇත්තේය.

**35 වැනි වගන්තිය**

1. 34 වැනි වගන්තියේ සඳහන් කරන ලද අන්දමේ ඕනෑම ආරාවුලක් හෝ තත්ත්වයක් ආරක්ෂක මණ්ඩලයේ හෝ මහා මණ්ඩලයේ හෝ අවධානයට යොමු කරවීමට එක්සත් ජාතීන්ගේ ඕනෑම සාමාජික රටකට බලය ඇත්තේය.

2. එක්සත් ජාතීන්ගේ සාමාජිකයකු නුවූ රටක් යම්කිසි ආරාවුලක් සාමදානයෙන් බේරුම් කරගැනීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියෙහි දැක්වෙන බැඳීම් කලින් පිළිගෙන තිබේ නම් ඒ රට හා සම්බන්ධව පවත්නා ඕනෑම වාදභේදයක් ආරක්ෂක මණ්ඩලයේ හෝ මහා මණ්ඩලයේ හෝ අවධානයට යොමු කරවීමට ඒ රටට බලය ඇත්තේය.

3. මේ වගන්තිය යටතෙහි ස්වකීය අවධානයට යොමු කරවන ලද කරුණු සම්බන්ධයෙන් මහා මණ්ඩල පරිපාටිය 11 වැනි හා 12 වැනි වගන්තිවල විධිවිධානයන්ට යටත් වන්නේ ය.

**36 වැනි වගන්තිය**

1. 33 වැනි වගන්තියේ සඳහන් කරන ලද අන්දමේ ආරාවුලක් හෝ එවැනි තත්ත්වයක් හෝ පිළිබඳ වූ අවස්ථාවක දී වුව ද එය බේරා දැමීම පිණිස සුදුසු කවර හෝ ක්‍රියාමාර්ග හෝ නිර්දේශ කිරීමට ආරක්ෂක මණ්ඩලයට බලය ඇත්තේ ය.

2. පාර්ශ්වකාරයන් විසින් ඒ ආරාවුල බේරුම් කරගැනීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලද්දේ නම් ආරක්ෂක මණ්ඩලය විසින් ඒ ක්‍රියාමාර්ග ගැන ද සලකා බැලිය යුතුය.

3. ජාත්‍යන්තර අධිකරණ මණ්ඩලයේ ප්‍රඥප්ති සංග්‍රහයෙහි දැක්වෙන විධිවිධාන අනුව එකී පාර්ශ්වකාරයින් විසින් නීතිය අතින් ඇතිවන ආරාවුල් සාමාන්‍ය වශයෙන් සැළකළ යුත්තේ ඒ අධිකරණ මණ්ඩලය වෙත බව ද මේ වගන්තිය යටතේ නිර්දේශ ඉදිරිපත් කරන විට ආරක්ෂක මණ්ඩලය විසින් සැළකිය යුතුය.

**37 වැනි වගන්තිය**

1. 33 වැනි වගන්තියේ සඳහන් කරන ලද අන්දමේ ආරාවුලකට සම්බන්ධව සිටින පාර්ශ්වකාරයින් ඒ වගන්තියේ දක්වා ඇති ක්‍රම අනුව ඒ ආරාවුල බේරුම් කර ගැනීමට බැරි නම් ඔවුන් විසින් ඒ බව ආරක්ෂක මණ්ඩලයට දැන්විය යුතුය.

2. ඒ ආරාවුල දිගටම පැවතුණොත් ඇත්ත වශයෙන්ම ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමට හානි සිදුවිය හැකි බව ආරක්ෂක මණ්ඩලයට හැඟේ නම් 36 වැනි වගන්තිය යටතේ කළ යුතු ද කියා හෝ එසේ නැතහොත් සුදුසු යැයි කල්පනා වන පරිද්දෙන් යම් යම් බේරුම් කොන්දේසි නිර්දේශ කළ යුතු ද කියා හෝ ආරක්ෂක මණ්ඩලය විසින් තීරණය කළ යුතුය.

**38 වැනි වගන්තිය**

යම් ආරාවුලකට සම්බන්ධව සිටින පාර්ශ්වකාරයන් සියලු දෙනා ම ඒ ආරාවුල සාමදානයෙන් බේරුමක් කරගැනීමට තුඩුදෙන නිර්දේශ නිකුත් කරන ලෙස ඉල්ලීමක් කළොත් 33 වැන්නේ පටන් 37 වැන්න තෙක් ඇති වගන්තිවල විධිවිධානවලට පටහැනි නොවන සේ එකී පාර්ශ්වකාරයන්ට ඒ සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට ආරක්ෂක මණ්ඩලයට බලය ඇත්තේ ය.



6 - CM 4361

## VII වැනි පරිච්ඡේදය

# සාමයට තර්ජන, සාමය කඩකිරීම හා ආක්‍රමණික ක්‍රියා පිළිබඳව ක්‍රියා කිරීම

### 39 වැනි වගන්තිය

සාමයට යම් තර්ජනයක් හෝ සාමය කඩ කිරීමක් හෝ යම් ආක්‍රමණික ක්‍රියාවක් හෝ පවත්නේ ද යන වග නිශ්චය කරගෙන ආරක්ෂක මණ්ඩලය විසින් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වාගැනීම හෝ නැවත ඇති කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතුය. එසේ නැතහොත් ඒ සඳහා 41 වැනි හා 42 වැනි වගන්ති අනුව කවර විධිවිධාන සැලැස්විය යුතු ද යන වග තීරණය කළ යුතුය.

### 40 වැනි වගන්තිය

39 වැනි වගන්තියේ සඳහන් පරිදි නිර්දේශ ඉදිරිපත් කිරීමට හෝ යෙදිය යුතු විධිවිධාන ගැන තීරණය කිරීමට හෝ කලින් තත්ත්වය උග්‍රවීම වළක්වාලීම පිණිස අසවල් විධිවිධාන අවස්ථානුරූපව ඉෂ්ට කිරීම යෝග්‍යය නැතහොත් සුදුසුය කියා ආරක්ෂක මණ්ඩලයට හැඟේ නම්, එවැනි අවස්ථානුරූප විධිවිධාන ඉෂ්ට කරන ලෙස ප්‍රස්තුත කාරණයට සම්බන්ධ වූ පාර්ශ්වකාරයන්ට නියම කිරීමට ආරක්ෂක මණ්ඩලයට බලය ඇත්තේය. එවැනි අවස්ථානුරූප විධිවිධාන නියම කළ යුත්තේ පාර්ශ්වකාරයන්ගේ අයිතිවාසිකම්වලට හෝ ස්ථාවරයට හෝ තත්ත්වයට හෝ හානියක් නොවන හැටියටය . එවැනි අවස්ථානුරූප විධිවිධාන ඉෂ්ට කිරීම පැහැර හැරීම් ගැන යථා කාලයේ දී අරක්ෂක මණ්ඩලය කල්පනාවට ගත යුතුය.

### 41 වැනි වගන්තිය

ස්වකීය තීරණයක් ක්‍රියාවෙහි යෙදවීම සඳහා යුද්ධ බලය පාවිච්චි නොකර කවර විධිවිධාන යෙදිය හැකි ද යන වග තීරණය කිරීමටත් එවැනි විධිවිධාන යොදන ලෙස එක්සත් ජාතීන්ගේ සාමාජික රටවලට නියම කිරීමටත් ආරක්ෂක මණ්ඩලයට බලය ඇත්තේ ය. ආර්ථික සම්බන්ධතාවලට ද දුම්රිය නැව්, අහස් යානා, තැපැල් ටෙලිග්‍රාෆ්, ගුවන් විදුලිය යන මේ ආදී වශයෙන් ගමනාගමනය ඇතුළු පණිවිඩ හුවමාරු කිරීමේ වෙනත් මාර්ගවලට ද සම්පූර්ණ වශයෙන් ම හෝ මඳ වශයෙන් හෝ බාධා කිරීමත් රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධකම් අත්හිටුවීමටත් යථෝක්ත විධිවිධානවලට ඇතුළත් වෙති.

**42 වැනි වගන්තිය**

41 වැනි වගන්තියෙන් නියම කර තිබෙන විධිවිධාන ප්‍රමාණවත් නොවෙතැයි කියා හෝ ප්‍රමාණවත් නොවන බැව් ඔප්පු වී තිබේය කියා හෝ ආරක්ෂක මණ්ඩලයට හැඟී ගියොත් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමට හෝ නැවත ඇති කිරීමට හෝ අවශ්‍ය යැයි සැලකෙන අන්දමින් ගගන හමුදාවල හෝ නෞකා හමුදාවල හෝ පාබල හමුදාවල බලය යොදවා ක්‍රියා කිරීමට ආරක්ෂක මණ්ඩලයට බලය ඇත්තේ ය. එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල ගගන හමුදා හෝ නෞකා හමුදා හෝ පාබල හමුදා මගින් පවත්වන පෙළපාලි හා වටලෑම් හා වෙනත් සංග්‍රාම කාර්‍යයෝ මේ ක්‍රියා කලාපයට ඇතුළත් වෙති.

**43 වැනි වගන්තිය**

1. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමට උපකාර කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සියලුම සාමාජික රටවල් ආරක්ෂක මණ්ඩලයේ ඉල්ලීම් පිටත් විශේෂ ගිවිසුමක් නොහොත් ගිවිසුම් අනුවත් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පරිදි රටවල් මැදින් යාමේ අයිතිවාසිකම ද ඇතුළුව යුද හමුදාවක් ද උපකාර ද පහසුකම් ද ආරක්ෂක මණ්ඩලයට ලබා දීමට පොරොන්දු වෙති.

2. හමුදා ගණන හා වර්ග ඒ හමුදා කොතරම් දුරට සූදානමින් සිටය යුතු ද යන වග හා ඒවා සාමාන්‍යයෙන් නතර කළ යුත්තේ කොහි ද යන වග සැළසිය යුතු පහසුකම්වල හා උපකාරවල ස්වභාවය යන මේවා පිළිබඳ නියමයන් එකී ගිවිසුමේ නොහොත් ගිවිසුම්වල දක්වා තිබිය යුතුය.

3. ඒ ගිවිසුම නොහොත් ගිවිසුම් ඇති කරගැනීම සම්බන්ධයෙන් හැකිතාක් ඉක්මණින් සාකච්ඡා කරගැනීමට මුල පිරිය යුත්තේ ආරක්ෂක මණ්ඩලය යි. ඒ ගිවිසුම් ඇති කර ගත යුත්තේ ආරක්ෂක මණ්ඩලය හා සාමාජික රටවල් අතර හෝ එසේ නැතහොත් ආරක්ෂක මණ්ඩලය හා සාමාජික රටවල් සමූහයක් අතරය. ගිවිසුමට අත්සන් කරන සාමාජික රටවල් තම තමන්ගේ රාජ්‍යයන් ලවා ඒ ඒ රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනුව එකී ගිවිසුම් පසුව ස්ථිර කරවා ගත යුතුය.

**44 වැනි වගන්තිය**

යුද්ධ හමුදා බලය පාවිච්චි කිරීමට ආරක්ෂක මණ්ඩලය තීරණය කර ඇති විට 43 වැනි වගන්තිය යටතේ පිළිගෙන ඇති යුතුකම් ඉෂ්ට කිරීම සඳහා ඒ සභාවට ඇතුළත් නුවූ සාමාජික රටකින් යුද්ධ හමුදා බලය ලබා දෙන ලෙස ඉල්ලා සිටීමට කලින් ඒ සාමාජික රටේ යුද්ධ හමුදා බල ඇණි පාවිච්චි කිරීමට තීරණය කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලය පවත්වන සාකච්ඡාවලට සහභාගි වීමට ඒ රට කැමති නම් එසේ සහභාගි වන ලෙස ඒ සාමාජික රටටත් ආරාධනා කළ යුතුය.

**45 වැනි වගන්තිය**

එක්සත් ජාතීනට යුද්ධය පිළිබඳ අත්‍යවශ්‍ය ඉක්මන් කටයුතු යෙදීමට හැකිවනු පිණිස සාමාජික රටවල් මගින් ඒකාබද්ධ ජාත්‍යන්තර සංග්‍රාම ව්‍යාපාරයක් ගෙන යෑම උදෙසා තම තමන්ගේ ජාතික ගුවන් බල ඇණි ලබා දිය යුතුය. යුද්ධාධිකාරී කාරක සභාවේ සහායය ඇතිව ආරක්ෂක මණ්ඩලය විසින් මේ බලඇණිවල ශක්ති ප්‍රමාණයත්, ඒවා කොතරම් දුරට සූදානම්ව සිටිනවාද යන වගත්, ස්වකීය ඒකාබද්ධ සංග්‍රාම ව්‍යාපාරය ගෙන යාමට බලාපොරොත්තු මාර්ගයත්, පිළිබඳව තීරණය කර ගත යුත්තේ 43 වැනි වගන්තියේ සඳහන් කරන ලද විශේෂ ගිවිසුමේ නොහොත් ගිවිසුම්වල විධිවිධාන සලස්වා ඇති ආකාරයටය.

**46 වැනි වගන්තිය**

ආරක්ෂක මණ්ඩලය විසින් යුද හමුදා මෙහෙයවීම පිළිබඳ වැඩපිළිවෙළවල් සකස් කර ගත යුත්තේ යුද්ධාධිකාරී කාරක සභාවේ සහාය ඇතිවය.

**47 වැනි වගන්තිය**

1. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමය, තමන්ට බාරදී ඇති යුද හමුදාවලින් වැඩ ගැනීම හා ඒ යුද හමුදා මෙහෙයවීමය, යුද්ධායුධ සීමා කිරීමය, නිරායුධ කිරීමට ඇති ඉඩකඩ යන මේ කරුණු සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලයේ සංග්‍රාම කාර්‍යයන්ට අදාළ වන සියලුම ප්‍රශ්න ගැන ආරක්ෂක මණ්ඩලයට උපදෙස් දීම සඳහාත් ආධාර කිරීම සඳහාත් යුද්ධාධිකාරී කාරක සභාවක් පිහිටුවා ගත යුතුය.

2. යුද්ධාධිකාරී කාරක සභාව වූ කලී ආරක්ෂක මණ්ඩලයේ ස්ථිර සාමාජික රටවල යුද්ධ නායකයන්ගෙන් හෝ ඔවුන්ගේ නියෝජිතවරුන්ගෙන් හෝ සමන්විත විය යුත්තකි. මේ කාරක සභාවේ වගකීම් මැනවින් ඉෂ්ට කිරීම සඳහා කාරක සභාවේ ස්ථිර සාමාජිකයෙකු නුවූ එක්සත් ජාතීන්ගේ යම් සාමාජික රටක් ස්වකීය කටයුතුවලට සහභාගි කරවා ගැනීමට වුවමනා වූ විටක ස්වකීය කටයුතුවලට සහභාගි වන ලෙස කාරක සභාව ඒ රටට ආරාධනා කළ යුතුය.

3. ආරක්ෂක මණ්ඩලයට සුදුස්සක් කිරීමට භාරදී ඇති යුද්ධ හමුදාවන් යුධෝපාය කෞශල්‍යයෙන් මෙහෙයවීම සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලය යටතෙහි වූ යුද්ධාධිකාරී කාරක සභාව විසින් වග කිව යුතුය. එකී හමුදාවලට අණ දීමේ කටයුතු පසුව සංවිධාන කර ගත යුතුය.

4. ආරක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව ද නිසි ප්‍රාදේශීය නියෝජ්‍ය මණ්ඩල හා සම්මන්ත්‍රණය කර ගැනීමෙන් පසුව ද ප්‍රාදේශීය අනුකාරක සභා පිහිටුවීමට යුද්ධාධිකාර කාරක සභාවට බලය ඇත්තේ ය.

## 48 වැනි වගන්තිය

1. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වාගැනීම සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලයේ නිගමනයන් ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය වූ වැඩ කටයුතු ආරක්ෂක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට එක්සත් ජාතීන්ගේ සියලුම සාමාජික රටවල් විසින් හෝ ඒවායින් සමහරක් විසින් හෝ ඉෂ්ට කළ යුතුය.

2. එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් එක එල්ලේ ම ද, ඒ ඒ රටවල් සාමාජිකයන් කොට ඇත්තාවූ ඒ ඒ ජාත්‍යන්තර නියෝජ්‍ය මණ්ඩල මාර්ගයෙන් ද එකී නිගමනයන් ක්‍රියාත්මක කළ යුතුය.

## 49 වැනි වගන්තිය

ආරක්ෂක මණ්ඩලය විසින් තීරණය කර ගන්නා ලද විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීම සඳහා එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් අන්‍යෝන්‍ය සහයෝගයෙන් සහාය වීමට ඉදිරිපත් විය යුතුය.

## 50 වගන්තිය

ආරක්ෂක මණ්ඩලය විසින් යුද්ධය වැළැක්වීමේ හෝ යුද්ධ බලය යෙදවීමේ හෝ ක්‍රියාමාර්ගයක් යම් රාජ්‍යයකට විරුද්ධව ගෙන යන විට එක්සත් ජාතීන්ගේ සමාජිකයෙකු වූ හෝ නුවූ හෝ වෙනත් යම් රාජ්‍යයකට ඒ කටයුතු කරගෙන යෑම නිසා විශේෂ ආර්ථික ප්‍රශ්නවලට මුහුණ පාන්නට සිදුවේ නම් ඒ ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලය හා සාකච්ඡා කිරීමට ඒ රාජ්‍යයට බලය තිබිය යුතුය.

## 51 වැනි වගන්තිය

එක්සත් ජාතීන්ට අයත් සාමාජික රටකට යුද්ධාක්‍රමණයක් ඇති වුවහොත් ආරක්ෂක මණ්ඩලය විසින් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමට අවශ්‍ය විධිවිධාන යොදන තුරු, පෞද්ගලික වශයෙන් හෝ වේවා සාමූහික වශයෙන් හෝ වේවා ආත්මාරක්ෂාව සම්බන්ධයෙන් ඒ රටට ඇති ආවේණික අයිතිවාසිකමට මේ ප්‍රඥප්තියේ දැක්වෙන කිසිවකින් බාධාවක් නො විය යුතුය. ආත්මාරක්ෂාව සම්බන්ධයෙන් ඇති මේ අයිතිවාසිකම් අනුව සාමාජික රටවල් මගින් කරන ලද කටයුතු ආරක්ෂක මණ්ඩලය වෙත වහාම වාර්තා කළ යුතුය. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා කළ යුතුව තිබෙන දේ ඕනෑම වේලාවක දී ඉෂ්ටකිරීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තිය යටතේ ආරක්ෂක සභාව කෙරෙහි පැවරී ඇති බලයට හා වගකීමකට ආත්මාරක්ෂාව උදෙසා කරන ලද ඒ කටයුතු නිසා මොනම අන්දමකින්වත් හානියක් නොවිය යුතුය.

# VIII වැනි පරිච්ඡේදය

## ප්‍රාදේශීය විධිවිධාන

**52 වැනි වගන්තිය**

1. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමට අදාළ කරුණු ගැන ප්‍රාදේශීය වශයෙන් ක්‍රියා කිරීම අරභයා ලෝකයේ ඒ ඒ ප්‍රදේශවලට සුදුසු වන පරිද්දෙන් ප්‍රාදේශීය විධිවිධාන හෝ නියෝජ්‍ය ආයතන හෝ පවත්වා ගෙන යාම ගැන මේ ප්‍රඥප්තියේ 159 වැනි වගන්තියෙන් කිසිම බාධාවක් නැත්තේ ය. එසේකුදු වුවත්, ඒ හෝ නියෝජ්‍ය ආයතන ද ඒවායේ කටයුතු ද එක්සත් ජාතීන්ගේ පරමාධ්‍යාශවලට හා ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය.

2. එබඳු ප්‍රාදේශීය විධිවිධාන සකස් කර ගන්නා වූ හෝ එබඳු නියෝජ්‍ය ආයතන පිහිටුවා ගන්නා වූ හෝ එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් ප්‍රාදේශීය ආරවුල් ආරක්ෂක මණ්ඩලය වෙත පමුණුවාලීමට මත්තෙන් එකී ප්‍රාදේශීය විධි විධාන මාර්ගයෙන් හෝ ඒ ආරාවුල් සාමකාමීව බේරා ගැනීමට ප්‍රයත්න දැරිය යුතු ය.

3. අදාල රාජ්‍යයන්ගේ මෙහෙයීමෙන් හෝ ආරක්ෂක මණ්ඩලය විසින් යොමු කරනු ලැබීමෙන් හෝ කලාපීය ආරවුල් එබඳු කලාපීය වැඩ පිළිවෙල මගින් හෝ එබඳු කලාපීය ආයතන මගින් හෝ සාමකාමීව නිරාකරණයකොට ගැනීම ප්‍රවර්ධනය ආරක්ෂක මණ්ඩලය විසින් දිරිමත් කළ යුත්තේ ය.

4. 34 වැනි හා 35 වැනි වගන්ති අනුව ක්‍රියා කිරීමට ඇති බලයට මොනම අන්දමකින්වත් මේ වගන්තියෙන් හානියක් සිදු නොවේ.

**53 වැනි වගන්තිය**

1. ආරක්ෂක මණ්ඩලය විසින් ස්වකීය බලය යටතේ කෙරෙන සංග්‍රාම කාර්‍යයන් සඳහා එකී ප්‍රාදේශීය විධිවිධාන හෝ නියෝජ්‍ය මණ්ඩල හෝ සුදුසු අවස්ථාවලදී උපයෝගී කර ගත යුතුය. එහෙත් 107 වැනි වගන්තියේ විධිවිධාන සලස්වා ඇති අන්දමට මේ වගන්තියේ 2 වැනි ඡේදයේ දක්වා ඇති යම්කිසි සතුරු රාජ්‍යයකට විරුද්ධව කටයුතු කිරීම හෝ ඒ ඒ ආණ්ඩුවල ඉල්ලීම් පිට එවැනි රාජ්‍යයකින් කෙරෙන ආක්‍රමණය වැළැක්වීම එක්සත් ජාතීන්ට පැවරෙනතුරු එබඳු යම් රාජ්‍යයකින් නැවත

අනුගමනය කරන ආක්‍රමණික ක්‍රියා මාර්ගයකට විරුද්ධව ප්‍රාදේශීය වශයෙන් කටයුතු කිරීම හැර ආරක්ෂක මණ්ඩලයේ බලය පැවරීමක් නැතිව ප්‍රාදේශීය ආයතන යටතේ හෝ නියෝජ්‍ය ආයතන මගින් කිසිම සංග්‍රාම කාර්යයක් නොකළ යුතුය.

2. මේ වගන්තියේ 1 වැනි ඡේදයේ යොදා ඇති "සතුරු රාජ්‍යය" යන පදය ව්‍යවහාර වන්නේ මේ ප්‍රඥප්තියට අත්සන් කර ඇත්තා වූ කවර රටකට හෝ දෙවැනි ලෝක යුද්ධයේ දී සතුරුව සිටි ඕනෑම රාජ්‍යයකි.

**54 වැනි වගන්තිය**

ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම අරභයා ප්‍රාදේශීය විධිවිධාන යටතේ හෝ ප්‍රාදේශීය නියෝජ්‍ය ආයතන මගින් හෝ භාරගෙන ඇත්තාවූ නොහොත් කල්පනාවට භාජනය කර තිබෙන්නාවූ කටයුතු මේ මේවා යයි සියලු කල්හි ම සම්පූර්ණ වශයෙන් ආරක්ෂක මණ්ඩලයට දැනුම් දිය යුතුය.

## IX වැනි පරිච්ඡේදය

# ජාත්‍යන්තර ආර්ථික හා සාමාජයීය සහයෝගිතාව

### 55 වැනි වගන්තිය

ජාතීන්ගේ සමාන අයිතිවාසිකම් හා ස්වෛරීභාවය පිළිබඳ ප්‍රතිපත්ති කෙරෙහි ඇති ගෞරවය පාදක කොටගෙන අන්තර්ජාතික සාමකාමී සුහද සම්බන්ධතාවලට අවශ්‍ය චිරස්ථිතිය හා ශුභ සිද්ධිය ඇති කිරීම සඳහා එක්සත් ජාතීන් විසින්—

(අ) වඩා උසස් ජීවන තත්ත්වයන්, සියලු දෙනාටම රැකීරක්ෂා, ආර්ථික හා සාමාජයීය ප්‍රගතිය හා සංවර්ධනයට තුඩුදෙන තත්ත්වයක් ඇති කිරීමටත්;

(ආ) ආර්ථික, සෞඛ්‍ය, සාමාජයීය හා තදානුබද්ධ ජාත්‍යන්තර ප්‍රශ්න නිරාකරණය කිරීමට හා ජාත්‍යන්තර සංස්කෘතික හා අධ්‍යාපනික සහයෝගය වර්ධනය කිරීමටත්;

(ඇ) ජාති භේද, ස්ත්‍රී පුරුෂ භේද, භාෂා භේද හෝ ආගම් භේද ගැන නොතකා මිනිස් අයිතිවාසිකම් කෙරෙහි සියලු දෙනාගේ ම ගෞරවය ඇති කිරීමට හා එය වර්ධනය කිරීමටත් ක්‍රියා කළ යුතුය.

### 56 වැනි වගන්තිය

55 වැනි වගන්තියේ දක්වන ලද පරමාර්ථ මුදුන් පමුණුවාලීම පිණිස කවුරුත් එකතුව ද එක් එක්කෙනා තනි තනිව ද සංවිධානයට සහයෝගය දක්වමින් ක්‍රියා කිරීමට සියලු සාමාජික රටවල් පොරොන්දු වෙති.

### 57 වැනි වගන්තිය

1. එකිනෙක ආණ්ඩු අතර ඇති කර ගන්නා ලද ගිවිසුම් මාර්ගයෙන් පිහිටුවා ඇත්තාවූ ද ස්වකීය මූලික ව්‍යවස්ථා මාලාවන් හි විස්තර කරන ලද පරිදි ආර්ථික, සාමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, සෞඛ්‍ය හා තදානුබද්ධ වෙනත් කටයුතු අතින් පැටුල ජාත්‍යන්තර වගකීම් ඇත්තාවූ ද විවිධ විශේෂිත ආයතන 63 වැනි වගන්තියේ විධිවිධානවලට අනුව එක්සත් ජාතීන්ට ඒකාබද්ධ කළ යුතුය.

2. එක්සත් ජාතීන් සමග ඒකාබද්ධ කරන ලද එවැනි නියෝජ්‍ය මණ්ඩල මෙහි මින් පසු විශේෂිත ආයතන යනුවෙන් සඳහන් කරනු ලැබේ.

**58 වැනි වගන්තිය**

විශේෂිත ආයතනවල ප්‍රතිපත්ති හා කාර්යයන් ඒකයෝගී කිරීම සඳහා එක්සත් ජාතීන් අවශ්‍ය නිර්දේශ කළ යුතුය.

**59 වැනි වගන්තිය**

55 වැනි වගන්තියේ දක්වන ලද පරමාර්ථ ඉෂ්ට කිරීම සඳහා අභිනවයෙන් පිහිටුවීමට අවශ්‍ය විශේෂිත ආයතන පිහිටුවාලීමට සුදුසු අවස්ථාවන්හි දී එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් එකී රාජ්‍යයන් සමග සාකච්ඡා කිරීමට ක්‍රියාරම්භ කළ යුතුය.

**60 වැනි වගන්තිය**

සංවිධානය සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ දක්වා ඇති කාර්යයන් ඉෂ්ට කිරීම් සඳහා වූ වගකීම් පැවරී ඇත්තේ මහා මණ්ඩලයටය. මහා මණ්ඩලයේ බලයට යටත්ව ක්‍රියා කරන ආර්ථික හා සමාජ මණ්ඩලයට X වැනි පරිච්ඡේදයේ දක්වා ඇති බලතල තිබිය යුතුය.

## X වැනි පරිච්ඡේදය

# ආර්ථික හා සමාජ මණ්ඩලය

**61 වැනි වගන්තිය**

1. ආර්ථික හා සමාජ මණ්ඩලය මහා මණ්ඩලයෙන් තෝරා ගනු ලැබුවාවූ ද එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් වූ ද සාමාජික රටවල් පනස් හතරකින් සමන්විත විය යුතුය.

2. 3 වැනි ඡේදයේ විධිවිධානවලට යටත්ව එක් එක් අවුරුද්දෙහි දී ආර්ථික හා සමාජ මණ්ඩලයට තුන් අවුරුදු කාල පරිච්ඡේදයක් සඳහා සාමාජිකයන් 18 දෙනෙකු තෝරා පත් කර ගත යුතුය. තුන් වර්ෂය අවසානයේදී සාමාජිකත්වයෙන් අස් වී යන සාමාජිකයකු ඒ එක්කම නැවත තෝරා පත්කර ගනු ලැබිය හැකිය.

3. සාමාජික සංඛ්‍යාව විසිහත් දෙනකුගෙන් පනස් හතර දෙනකුට වැඩි කිරීමෙන් පසු පැවැත්වෙන පළමුවැනි තේරීමේ දී ඒ වර්ෂයේ සාමාජිකත්වය අවසන් වන නව දෙනා වෙනුවෙන් තෝරා පත් කරනු ලබන නව දෙනාට අතිරේකව තවත් සාමාජිකයින් විසිහත් දෙනෙකු තෝරා පත් කර ගත යුතුය. මේ අතිරේක විසි හත් දෙනාගෙන් මහා මණ්ඩලය යොදා ගන්නා වැඩ පිළිවෙල අනුව නව දෙනෙකුගේ සාමාජිකත්වය එක් අවුරුද්දක් අවසානයේ දී ද තවත් නව දෙනකුගේ සාමාජිකත්වය දෑවුරුද්දක් අවසානයේ දී ද අහෝසි විය යුතුය.

4. එක් එක් සාමාජික රට වෙනුවෙන් ආර්ථික හා සමාජ මණ්ඩලයෙහි පෙනී සිටිය යුත්තේ එක නියෝජිතයකු පමණකි.

## *කර්තව්‍යයන් හා බලතල*

**62 වැනි වගන්තිය**

1. ජාත්‍යන්තර, ආර්ථික, සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, සෞඛ්‍ය හා තදානුබද්ධ කාරණා සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට නොහොත් වාර්තා කිරීමට හෝ ඒ පිළිබඳ ක්‍රියාරම්භ කිරීමට ද එකී යම් කාරණයක් සම්බන්ධයෙන් මහා මණ්ඩලයට හා එක්සත් ජාතීන්ට අයත් සාමාජික රටවලටත් ඒ ඒ කාරණාවලට

අදාළ විශේෂිත ආයතනවලටත් නිර්දේශ කිරීමට ද ආර්ථික හා සමාජ මණ්ඩලයට බලය ඇත්තේ ය.

2. සියලු දෙනාටම තිබිය යුතු මිනිස් අයිතිවාසිකම් හා මූලික ස්වාධීනත්වය කෙරෙහි ගෞරවය ඇති කිරීම හා එය වර්ධනය කිරීම සඳහා නිර්දේශ කිරීමට මේ මණ්ඩලයට බලය ඇත්තේය.

3. ස්වකීය විෂය මාලාවට ඇතුළත් වන කාරණා සම්බන්ධයෙන් මහා මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා ගිවිසුම් කෙටුම්පත් කිරීමට මේ මණ්ඩලයට බලය ඇත්තේය.

4. ස්වකීය විෂය මාලාවට ඇතුළත් වන කාරණා සම්බන්ධයෙන් එක්සත් ජාතීන් විසින් නියම කරන ලද නියෝග අනුව අන්තර්ජාතික සම්මේලන කැඳවීමට මේ මණ්ඩලයට බලය ඇත්තේය.

**63 වැනි වගන්තිය**

1. 57 වැනි වගන්තියේ සඳහන් කරන ලද යම්කිසි ආයතනයක් එක්සත් ජාතීන්ගේ සංවිධානයට සම්බන්ධ කර ගත යුත්තේ කවර කොන්දේසි උඩ ද යන වග දැක්වෙන ගිවිසුම් ඒ ඒ ආයතනය සමග ඇති කරගැනීමට ආර්ථික හා සමාජ මණ්ඩලයට බලය ඇත්තේය. එසේ ඇති කර ගන්නා ගිවිසුම් පසුව මහා මණ්ඩලයෙන් අනුමත කරගත යුතුය.

2. විශේෂිත ආයතන සමග කෙරෙන සාකච්ඡා හා එකී ආයතනවලට කරනු ලබන නිර්දේශ මාර්ගයෙන් ද මහා මණ්ඩලයට හා එක්සත් ජාතීන්ගේ සාමාජික රටවලට කරනු ලබන නිර්දේශ මාර්ගයෙන් ද එකී ආයතනවල කටයුතු ඒකාබද්ධ කිරීමට මේ මණ්ඩලයට බලය ඇත්තේය.

**64 වැනි වගන්තිය**

1. විශේෂිත ආයතනවලින් නොකඩවා වාර්තා ලබා ගැනීම සඳහා නිසි කටයුතු යෙදීමට ආර්ථික හා සමාජ මණ්ඩලයට බලය ඇත්තේය. ස්වකීය නිර්දේශයන් ද ස්වකීය විෂය මාලාවට ඇතුළත් වන කරුණු සම්බන්ධයෙන් මහා මණ්ඩලයෙන් කරන ලද නිර්දේශයන් ද ක්‍රියාත්මක කිරීම පිණිස කරන ලද කටයුතු පිළිබඳ වාර්තා ලබා ගැනීමට එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් සමගත් විශේෂිත ආයතන සමගත් වැඩ පිළිවෙල යොදා ගැනීමට මේ මණ්ඩලයට බලය ඇත්තේය.

2. මේ වාර්තා පිළිබඳ ස්වකීය අදහස් උදහස් මහා මණ්ඩලය වෙත දැනුම් දීමට මේ මණ්ඩලයට බලය ඇත්තේය.

**65 වැනි වගන්තිය**

ආර්ථික හා සමාජ මණ්ඩලය විසින් ආරක්ෂක මණ්ඩලයට තොරතුරු දන්වා එහි ඉල්ලීම පිට ආරක්ෂක මණ්ඩලයට ආධාර උපකාර කළ යුතුය.

### 66 වැනි වගන්තිය

1. ආර්ථික හා සමාජ මණ්ඩලය විසින් මහා මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් ස්වකීය විෂය මාලාවට ඇතුළත් වන කර්තව්‍යයන් ඉෂ්ට කළ යුතුය.

2. එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල ඉල්ලීම පිටත් විශේෂිත ආයතනවල ඉල්ලීම පිටත් මහා මණ්ඩලයේ අනුමැතිය ඇතිව යම් යම් සේවාවන් කිරීමට මේ සභාවට බලය ඇත්තේය.

3. මේ ප්‍රඥප්තියෙහි අන් තැනක දක්වා ඇත්තාවූ හෝ, මහා මණ්ඩලයෙන් පවරනු ලබන්නාවූ හෝ වෙනයම් කාරණා ඇතොත් ඒ කාරණා ද මේ මණ්ඩලය විසින් ඉෂ්ට කළ යුතුය.

## *ඡන්දය දීම*

### 67 වැනි වගන්තිය

1. ආර්ථික හා සමාජ මණ්ඩලයේ එක සාමාජිකයකුට ඇත්තේ එක ඡන්දයක් පමණකි.

2. ආර්ථික හා සමාජ මණ්ඩලය ඉදිරියේ ඇති ප්‍රශ්ණ තීරණය කළ යුත්තේ සභා රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙනි.

## *කාර්‍ය පරිපාටිය*

### 68 වැනි වගන්තිය

ආර්ථික හා සමාජ කටයුතු පිළිබඳව හා මානව අයිතිවාසිකම් සංවර්ධනය කිරීම සඳහා කොමිෂන් සභා ද ස්වකීය කටයුතු ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය වන වෙනත් කොමිෂන් සභා ද ආර්ථික හා සමාජ මණ්ඩලය විසින් පිහිටුවාලිය යුතුය.

### 69 වැනි වගන්තිය

ආර්ථික හා සමාජ මණ්ඩලය විසින් එක්සත් ජාතීන්ගේ යම් සාමාජික රටකට විශේෂ වශයෙන් අදාළ වන යම් කාරණයක් ගැන සාකච්ඡා කරන විට ඒ රටට ද ඡන්ද බලයක් නැතිව ස්වකීය සාකච්ඡාවලට සහභාගි වන ලෙස ආරාධනය කළ යුතුය.

**70 වැනි වගන්තිය**

ඡන්ද බලයක් නැතිව විශේෂිත ආයතනවල නියෝජිතයන්ට ආර්ථික හා සමාජ මණ්ඩලයේ සාකච්ඡාවලට හා තමන් විසින් පිහිටුවන ලද කොමිෂන් සභාවල සාකච්ඡාවලට සහභාගිවීමට පුළුවන්වීම සඳහාත් ස්වකීය නියෝජිතයන්ට විශේෂිත ආයතනවල සාකච්ජාවලට සහභාගිවීමට පුළුවන්වීම සඳහාත් විධිවිධාන සැලැස්වීමට ආර්ථික හා සමාජ මණ්ඩලයට බලය ඇත්තේය.

**71 වැනි වගන්තිය**

ස්වකීය විෂය මාලාවට ඇතුළත් කාරණා සම්බන්ධයෙන් කටයුතු කරන්නාවූ ද ආණ්ඩුවේ සම්බන්ධයක් නැත්තා වූ ද, සංවිධාන සමග සම්මන්ත්‍රණ කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙළවල් යොදා ගැනීමට ආර්ථික හා සමාජ මණ්ඩලයට බලය ඇත්තේය. එක්සත් ජාතීන්ගේ ඒ ඒ සාමාජික රට සමග සම්මන්ත්‍රණය කිරීමෙන් පසුව, අන්තර් ජාතික සංවිධානයන් සමග ද සුදුසු ප්‍රස්ථාවන් හි දී ජාතික සංවිධානයන් සමග ද, එබඳු විධිවිධාන යොදා ගත හැකිය.

**72 වැනි වගන්තිය**

1. සභාපති තෝරා පත්කර ගැනීමේ ක්‍රමය ද ඇතුළුව ස්වකීය කාර්‍ය්‍ය පරිපාටිය පිළිබඳ නීතිරීති ආර්ථික හා සමාජ මණ්ඩලය විසින් ම සකස් කර ගත යුතුය.

2. ස්වකීය සාමාජිකයන්ගෙන් වැඩි දෙනාගේ ඉල්ලීම පිට රැස්වීම කැඳවීම සම්බන්ධයෙන් ද විධිවිධාන ඇතුළත් විය යුතු ස්වකීය නීතිරීතිවලින් නියම කර ඇති ආකාරයට ආර්ථික හා සමාජ මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතුය.

## XI වැනි පරිච්ඡේදය

# ස්වාධීන නොවූ රටවල් පිළිබඳ ප්‍රකාශනය

**73 වැනි වගන්තිය**

සම්පූර්ණ ස්වරාජ්‍ය තත්ත්වයට මෙතෙක් නොපැමිණියා වූ ජාතීන් සිටින රටවල් පාලනය කිරීමේ වගකීම ඇත්තාවූ නොහොත් බාරගෙන සිටින්නාවූ එක්සත් ජාතීන්ගේ සාමාජිකයෝ ඒ රටවල වාසය කරන මිනිසුන්ගේ අයිතිවාසිකම් ඉතාමත් වැදගත් ය යන ප්‍රතිපත්තිය පිළිගන්නා අතරම, ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියෙන් සම්පාදිත කාර්ය පද්ධතිය ඇතුළත කටයුතු කරමින් ඒ රටවල වැසියන්ගේ ශුභසිද්ධිය සැලැස්වීම ද ඒ පරමාර්ථය උදෙසා—

(අ) ඒ ඒ ජාතීන්ගේ සංස්කෘතිය ගැන නිසි ගෞරවයක් ඇතිව දේශපාලන තත්ත්වය හා ආර්ථික තත්ත්වයද සමාජ තත්ත්වය ද හා අධ්‍යාපන තත්ත්වය ද අතින් ඔවුන්ගේ අභිවෘද්ධිය සැලසීමට හා ඔවුන්ට විරුද්ධව කෙරෙන අයුතුකම්වලින් ඔවුන් ආරක්ෂා කිරීමට ද,

(ඉ) එක් එක් රටේ හා එහි වැසියන්ගේ විශේෂ තත්ත්වයන් අනුව ද ඒ ඒ රට ලබා ඇති දියුණුවේ ප්‍රමාණය අනුව ද ඒ ඒ රටවල ස්වීය පාලනය වැඩි දියුණු කිරීමට ද ඒ ඒ රටවැසියනගේ දේශපාලන බලපොරොත්තු නිසි ලෙස ගණන් ගැනීමට හා ස්වාධීන දේශපාලනායතන ක්‍රමයෙන් වැඩි දියුණු කරගැනීමට ඔවුන්ට උපකාර වීමට ද,

(උ) ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව සඳහා අනුබල දීමට ද,

(ඒ) සංවර්ධනය පිළිබඳ වැඩදායක ක්‍රියා මාර්ග ඇති කිරීමට හා පර්යේෂණ කටයුතුවලට අනුබල දීමට ද මේ වගන්තියේ දක්වන ලද සමාජයීය ආර්ථික හා විද්‍යාත්මක අභිප්‍රායයන් ඉෂ්ට කර ගැනීමේ අදහසින් ඔවුනොවුන් සමගත් සුදුසු කාලවලදී හා අවස්ථාවලදී ජාත්‍යන්තර විශේෂඥ මණ්ඩල සමගත් සහයෝගයෙන් ක්‍රියා කිරීමට ද,

(ඔ) XII වැනි හා XIIII වැනි පරිච්ඡේද අදාළවන රටවල හැර පිළිවෙලින් ඒ ඒ සාමාජිකයන්ගේ වගකීමට පාත්‍ර වී ඇති රටවල ආර්ථික, සාමාජයීය හා අධ්‍යාපනික තත්ත්වයන් පිළිබඳ සංඛ්‍යාලේඛන හා වෙනත් ශිල්පීය තොරතුරු, ආරක්ෂක කටයුතු අතින් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලින් ඉඩ

ලැබී ඇති පමණින් නිතිපතා මහ ලේකම්ගේ දැනගැනීම පිණිස යැවීමට ද ඇති බැඳීම තම තමන් කෙරෙහි ඇති සුවිශුද්ධ වගකීමක් කොට පිළිගනිති.

## 74 වැනි වගන්තිය

ස්වකීය රාජධානීන් සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති මෙන් ම මේ පරිච්ඡේදය අදාළ වන රටවල් සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති ද, සාමාජයීය, ආර්ථික හා වාණිජ කටයුතු අතින් ලෝකයේ අවශේෂ රටවල අයිතිවාසිකම් හා ශුභ සිද්ධිය ගැන නිසි තැකීමක් ඇතිව හොඳ අසල්වැසියන් වශයෙන් ජීවත්වීමේ පොදු මූලාශ්‍රය කරගෙන සකස් විය යුතු බව එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් පිළිගනිති.

## XII වැනි පරිච්ඡේදය

# ජාත්‍යන්තර භාරකාරත්ව ක්‍රමය

### 75 වැනි වගන්තිය

පසු කාලයක දී වෙන වෙනම ඇති කරගන්නා ගිවිසුම් අනුව, තමන් යටතෙහි තබනු ලබන රටවල් ආණ්ඩු කිරීම හා පරිපාලනය කිරීම සඳහා එක්සත් ජාතීන් විසින් ස්වකීය බලයපිට, ජාත්‍යන්තර භාරකාරත්ව මණ්ඩලයක් පිහිටුවාලිය යුතුය. මෙහි මින්පසු මේ රටවලට, භාරයේ පවතින රටවල් යයි ව්‍යවහාර කරනු ලැබේ.

### 76 වැනි වගන්තිය

මේ ප්‍රඥප්තියෙහි 1 වැනි වගන්තියෙහි සඳහන් කරන ලද එක්සත් ජාතීන්ගේ පරමාධ්‍යාශයන් අනුව භාරකාරත්ව ක්‍රමයේ මූලික පරමාර්ථ විය යුත්තේ—

(අ) ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමට අනුබල දීම,

(ඉ) එක් එක් රටේ ද එහි වැසියන්ගේ විශේෂ තත්ත්වයන්ට හා ඒ ඒ ජාතීන්ගේ නිදහස් අදහස්වලට ද ගැළපෙන පරිද්දෙන් එක් එක් භාරකාර ගිවිසුමේ කොන්දේසිවලින් නියම කර තිබෙන හැටියටත්, භාරයේ පවතින රටවල වැසියන්ගේ දේශපාලනික, ආර්ථික හා අධ්‍යාපනික සංවර්ධනය සැලසීම හා ස්වරාජ්‍යය හෝ ස්වාධීනත්වය ලබා ගැනීම සඳහා ඔවුන් ක්‍රමයෙන් දියුණු කිරීම,

(උ) ජාතිභේද, ස්ත්‍රී පුරුෂ භේද හෝ ආගම් භේද ගැන නොතකා සියලු දෙනාගේම මිනිස් අයිතිවාසිකම් හා මූලික නිදහස කෙරෙහි ඇති ගෞරවය වැඩිදියුණු කිරීම හා ලෝකයේ සිටින විවිධ ජාතීන් අතර තිබිය යුතු අන්‍යෝන්‍ය අවශ්‍යභාවය පිළිගැනීමට අනුබල දීම,

(ඒ) එක්සත් ජාතීන්ගේ සියලුම සාමාජික රටවලටත්, ඒ රටවලට අයත් සියලු ජාතීන්ටත්, සාමාජයීය, ආර්ථික හා වාණිජ කටයුතු සම්බන්ධයෙන් සමාන ලෙස සලකනු ලැබීමට මෙන්ම පූර්වෝක්ත පර්මාර්ථ සාධනයට හානියක් නොවන ලෙසට ද, 80 වැනි වගන්තියේ සඳහන් විධිවිධානවලට යටත් ව ද යුක්තිය ඉෂ්ට කිරීම සම්බන්ධයෙන් එකී ජාතීන්ට සමානව සලකනු ලැබීමට ද ක්‍රියාකිරීම යන මේවාය.

**77 වැනි වගන්තිය**

1. භාරකාරත්ව මණ්ඩලය භාරකාර ගිවිසුම් මාර්ගයෙන් ඒ ක්‍රමය යටතේ තබා ඇති පහත සඳහන් වර්ගවලට වැටෙන රටවලට අදාළ විය යුතුය—

(අ) දැනට අධිකාර බලයපිට පවතින රටවල් ;

(ඉ) දෙවෙනි ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵලයක් වශයෙන් සතුරු රාජ්‍යන්ගෙන් වෙන් කර ගත හැකි රටවල්;

(උ) ඒ ඒ රටවල් ආණ්ඩු කිරීම ගැන වග කියන්නාවූ රාජ්‍යයන් විසින් සිය කැමැත්තෙන් ම මේ ක්‍රමය යටතේ තබා ගැනීමට භාරදෙන රටවල්.

2. පූර්වෝක්ත වර්ගවලට අයත් රටවල් අතුරෙන් භාරකාරත්ව මණ්ඩලයට ගත යුත්තේ කවර රටවල් ද යන වගත්, ඒ රටවල් ගත යුත්තේ කවර කොන්දේසි පිට ද යන වගත් පසුව ගිවිසගත යුතු කාරණයකි.

**78 වැනි වගන්තිය**

එක්සත් ජාතීන්ගේ සාමාජික රටක් යටතේ අධිකාර බලයපිට ඇති රටවල් සම්බන්ධයෙන් වූ විට ඒ අධිකාර බලය ද ඇතුළුව භාරකාරත්ව මණ්ඩලය යටතෙහි තැබීමට බලාපොරොත්තු වන එක් එක් රට පිළිබඳ කොන්දේසිත්, ඒවා වෙනස් කිරීම පිළිබඳ හා සංශෝධනය කිරීම පිළිබඳ වූ කොන්දේසිත් ඒ ඒ රටවලට එක එල්ලේ ම සම්බන්ධකමක් ඇත්තාවූ රාජ්‍යයක් විසින් ගිවිස ගත යුතුය. 83 වැනි හා 85 වැනි වගන්තිවලින් නියම කොට ඇති ආකාරයට මේ කොන්දේසි අනුමත කළ යුතුය.

**80 වැනි වගන්තිය**

1. 77 වැනි, 79 වැනි හා 81 වැනි වගන්ති යටතේ පිළියෙල කර ගන්නා එක් එක් භාරකාරත්ව ගිවිසුමෙන් එක් එක් රට භාරකාරත්ව ක්‍රමය යටතට පමුණුවා ලීමේ දී එකඟ වන ආකාරයට හැරුණු කල එකී ගිවිසුම් ඇති කර ගන්නා තුරු කවර රාජ්‍යයක් සතුව ඇත්තාවූ හෝ කවර ජාතියක් සතුව ඇත්තාවූද එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් මැදහත්ව අත්සන් කර තිබෙන ජාත්‍යන්තර නීති ලියවිල්ලක කොන්දේසි වලට ඇතුළත්ව ඇත්තාවූ ද මොන අන්දමේ අයිතිවාසිකමක් වුවත් කොයි ලෙසකින්වත් මේ පරිච්ඡේදයේ ඇති කිසිවකින් හෝ මේ පරිච්ඡේදයෙන් හෝ වෙනස් වේ යයි තේරුම් නොගත යුතුය.

2. අධිකාර බලයට යටත්වූ රටවල් හා වෙනත් රටවල් 77 වැනි වගන්තියෙහි නියමකර තිබෙන පරිද්දෙන් භාරකාරත්ව මණ්ඩලයට ගැනීම සම්බන්ධයෙන් වූ ගිවිසුම් ගැන සාකච්ඡා කිරීමත් ගිවිසුම් ඇතිකර ගැනීමත් ප්‍රමාද කිරීමට හෝ කල් දැමීමට හෝ මේ වගන්තියේ 1 වැනි ඡේදය සාධකයක් කර නොගත යුතුය.

**81 වැනි වගන්තිය**

භාරයේ පවතින එක් එක් රට සම්බන්ධයෙන් වූ භාරකාරත්ව ගිවිසුමෙහි, ඒ ඒ රට ආණ්ඩු කළ යුත්තේ කවර කොන්දේසි යටතේ ද යන වගත්, ඒ ඒ රට ආණ්ඩු කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු බලධාරියා අසවලාය යන වගත් සඳහන්විතිබිය යුතුය. මෙහි මින්පසු ආණ්ඩුව කරවන බලධාරියා යනුවෙන් සඳහන් කරනු ලබන එකී බලධාරියා වූ කලී සංවිධානයේ එක් රාජ්‍යයක් හෝ රාජ්‍යයන් කීපයක් හෝ මුළු සංවිධානයම හෝ විය හැකිය.

**82 වැනි වගන්තිය**

ඕනෑම භාරකාරත්ව ගිවිසුමකට අදාළ භාරයේ පවතින මුළු රටටම හෝ එහි කොටසකට හෝ අසුවන අසවල් ප්‍රදේශය නොහොත් ප්‍රදේශ 43 වැනි වගන්තිය යටතේ ඇතිකර ගත් ගිවිසුමකට හෝ ගිවිසුම්වලට හානියක් නැතිව, යුද්ධෝපාය අතින් වැදගත්ය කියා ඒ ඒ භාරකාරත්ව ගිවිසුමෙහි සඳහන් කරනු ලැබිය හැකිය.

**83 වැනි වගන්තිය**

1. භාරකාරත්ව ගිවිසුම්වල කොන්දේසි හා ඒ කොන්දේසි පිළිබඳ වෙනස් කිරීම් හෝ සංශෝධන අනුමත කිරීමත් ඇතුළුව යුද්ධෝපාය අතින් වැදගත්වූ ප්‍රදේශ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සියලු කර්තව්‍යයන් ඉෂ්ට කළ යුත්තේ ආරක්ෂක මණ්ඩලය විසිනි.

2. 76 වැනි වගන්තියේ දක්වන ලද මූලික පරමාර්ථ යුද්ධෝපාය අතින් වැදගත් වූ එක් එක් ප්‍රදේශයෙහි ජනතාව සම්බන්ධයෙන් බලපැවැත්විය යුතුය.

3. යුද්ධෝපාය අතින් වැදගත් වූ ප්‍රදේශවල දේශපාලනමය, ආර්ථික, සාමාජයීය හා අධ්‍යාපනික කටයුතු සම්බන්ධයෙන් භාරකාරත්ව මණ්ඩලය යටතේ එක්සත් ජාතීන්ට පැවරී ඇති කර්තව්‍යයන් ඉෂ්ට කිරීම සඳහා ආරක්ෂක මණ්ඩලය විසින් භාරකාරත්ව ගිවිසුම්වල විධිවිධානවලට යටත්ව ද ආරක්ෂාව පිළිබඳ කටයුතුවලට හානියක් නැතිව ද භාරකාරත්ව මණ්ඩලයේ සහය ලබාගත යුතුය.

**84 වැනි වගන්තිය**

ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා භාරයේ පවතින රටෙන් සිදුවිය යුතු වැඩ කොටස ඉටුකරවා ගැනීමට වගබලා ගැනීම ආණ්ඩුව කරවන බලධාරියාගේ යුතුකම විය යුතුය. මේ අදහස මුදුන් පමුණුවාලීම අරභයා ආණ්ඩුව කරවන බලධාරියාගෙන් ආරක්ෂක මණ්ඩලයට ඉටුවිය යුතු යුතුකම් ඉෂ්ට කිරීම සඳහා මෙන්ම භාරයට පමුණුවා ඇති රටේ ආරක්ෂාව සැලසීම හා නීතිය හා සාමය

පවත්වා ගැනීම සඳහා ඒ රටේ ස්වේච්ඡා සේවය හමුදා පහසුකම් හා ආධාර උපකාර ප්‍රයෝජනයට ගැනීමට ආණ්ඩුව කරවන බලධාරියාට බලය ඇත්තේය.

**85 වැනි වගන්තිය**

1. යුද්ධෝපාය අතින් වැදගත්කමක් ඇතැයි දක්වා නැති සියලුම ප්‍රදේශ සම්බන්ධයෙන් භාරකාරත්වය ගිවිසුම්වල කොන්දේසි ද ඒ කොන්දේසි පිළිබඳ වෙනස් කිරීම් හෝ සංශෝධන ද අනුමත කිරීම ඇතුළුව එක්සත් ජාතීන්ගේ කර්තව්‍යයන් ඉෂ්ට කළයුත්තේ මහා මණ්ඩලය විසිනි.

## XIII වැනි පරිච්ඡේදය

## භාරකාරත්ව මණ්ඩලය

**86 වැනි වගන්තිය**

1. භාරකාරත්ව මණ්ඩලය එක්සත් ජාතීන්ගේ පහත සඳහන් සාමාජික රටවලින් සමන්විත විය යුතුය—

(අ) භාරයේ පවතින රටවල් ආණ්ඩු කරන සාමාජික රටවල් ;

(ආ) 23 වැනි වගන්තියේ නම් වශයෙන් සඳහන් කරන ලද සාමාජිකයන් අතුරෙන් භාරයේ පවතින රටවල්, ආණ්ඩු නොකරන රටවල් ;

(ඇ) භාරයේ පවතින රටවල් ආණ්ඩු කරන්නා වූ එක්සත් ජාතීන්ගේ සාමාජික සංඛ්‍යාව එසේ ආණ්ඩු නොකරන්නා වූ සාමාජිකයන්ගේ ගණනට සමාන වන ආකාරයට භාරකාරත්ව මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාව සංයුක්ත කරවනු පිණිස මහා මණ්ඩලය විසින් තුන් අවුරුදු කාලපරිච්ඡේදයකට තෝරා පත් කරන වෙනත් සාමාජික රටවල්.

2. භාරකාරත්ව මණ්ඩලයේ එක් එක් සාමාජිකයා වෙනුවෙන් ඒ මණ්ඩලයෙහි කටයුතු කිරීමට විශේෂයෙන් සුදුසුකම්ලත් එක් පුද්ගලයකු බැගින් පත් කළ යුතුය.

**87 වැනි වගන්තිය**

මහා මණ්ඩලයට එහි බලයපිට ක්‍රියාකරන භාරකාරත්ව සභාවටත් ස්වකීය කර්තව්‍යයන් ඉෂ්ට කිරීමේ දී—

(අ) ආණ්ඩුව කරවන බලධාරියා ඉදිරිපත් කරන වාර්තා සලකා බැලීමටත්;

(ආ) පෙත්සම් භාරගෙන ආණ්ඩුව කරවන බලධාරියා සමග සම්මන්ත්‍රණය කොට ඒවා ගැන වග විභාග කිරීමටත්;

(ඇ) ආණ්ඩුව කරවන බලධාරියා සමග නියම කරගන්නා වේලාවල දී භාරයේ පවතින ඒ ඒ රටවල් කලින් කල බලන්නට යෑමට විධිවිධාන සැලැස්වීමටත්;

(ඈ) භාරකාරත්ව ගිවිසුම්වල කොන්දේසි අනුව පූර්වෝක්ත කටයුතු මෙන්ම වෙනත් කටයුතු කිරීමටත්, බලය ඇත්තේය.

**88 වැනි වගන්තිය**

භාරකාරත්ව මණ්ඩලය විසින් දේශපාලන හා ආර්ථික තත්ත්වය අතින් ද සමාජ තත්ත්වය හා අධ්‍යාපන තත්ත්වය අතින් ද භාරයේ පවතින එක් එක් රටෙහි වැසියන් ලබා ඇති ප්‍රගතිය පිළිබඳ ප්‍රශ්න මාලාවක් සම්පාදනය කළ යුතුය. තවද භාරයේ පවතින එක් එක් රටේ ආණ්ඩුව කරවන බලධාරියා විසින් මහා මණ්ඩලයේ අවධානයට සුදුසු වන පරිද්දෙන් එකී ප්‍රශ්න මාලාව මූලාශ්‍රය කරගෙන මහා මණ්ඩලය වෙත වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

**89 වැනි වගන්තිය**

1. භාරකාරත්ව මණ්ඩලයේ එක් සාමාජිකයකුට ඇත්තේ එක් ඡන්දයක් පමණකි.

2. භාරකාරත්ව මණ්ඩලය ඉදිරිපිට පමුණුවා ඇති ප්‍රශ්න තීරණය කළ යුත්තේ ඒ ඒ සභා රැස්වීමට පැමිණි ඡන්දය දෙන සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙනි.

**90 වැනි වගන්තිය**

1. සභාපති තෝරා පත් කරගැනීමේ ක්‍රම ඇතුළුව ස්වකීය කාර්ය සංවිධානය පිළිබඳ නීති රීති භාරකාරත්ව මණ්ඩලය විසින් ම සකස් කරගත යුතුය.

2. ස්වකීය සාමාජිකයන්ගෙන් වැඩි දෙනාගේ ඉල්ලීම පිට රැස්වීම් කැඳවීම සම්බන්ධයෙන් ද විධිවිධාන ඇතුළත් ස්වකීය නීති රීතිවලින් නියම කර ඇති ආකාරයට භාරකාරත්ව සභාවේ රැස්වීම් පැවැත්විය යුතුය.

**91 වැනි වගන්තිය**

භාරකාරත්ව මණ්ඩලය විසින් ආර්ථික හා සමාජ මණ්ඩලයට අදාළ කටයුතු සම්බන්ධයෙන් ඒ මණ්ඩලයේ ද විශේෂිත ආයතනවලට අදාළ කටයුතු සම්බන්ධයෙන් ඒ ආයතනවල ද සහාය සුදුසු අවස්ථාවන් හි දී ලබාගත යුතුය.

## XIV වැනි පරිච්ඡේදය

# ජාත්‍යන්තර අධිකරණ මණ්ඩලය

### 92 වැනි වගන්තිය

ජාත්‍යන්තර අධිකරණ මණ්ඩලය එක්සත් ජාතීන්ගේ ප්‍රධාන අධිකරණ සංස්ථාව විය යුතුය. එය ක්‍රියාත්මක විය යුත්තේ මේ ප්‍රඥප්තියෙහි ම කොටසක් වී ඇත්තාවූ ද, ජාත්‍යන්තර ස්ථිර අධිකරණ මණ්ඩලයෙහි ප්‍රඥප්ති සංග්‍රහය පාදක කොට සම්පාදිත වූ ද මීට අමුණා ඇති ප්‍රඥප්ති සංග්‍රහයට අනුකූලවය.

### 93 වැනි වගන්තිය

1. එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලත් සියලුම රටවල් ඒ කරුණින් ම ජාත්‍යන්තර අධිකරණ මණ්ඩලයේ ප්‍රඥප්ති සංග්‍රහයට ද සම්බන්ධ වූවෝ වෙති.

2. එක්සත් ජාතීන්ගේ සාමාජිකයකු නුවූ එක් එක් රාජ්‍ය සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ අනුව මහා මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කොන්දේසි පිට ඒ ඒ රාජ්‍යයට ද ජාත්‍යන්තර අධිකරණ මණ්ඩලයේ ප්‍රඥප්ති සංග්‍රහයට සම්බන්ධ විය හැකිය.

### 94 වැනි වගන්තිය

1. සාමාජික වූ තම රට හා සම්බන්ධ පැනනගින ඕනෑම නඩුවක දී ජාත්‍යන්තර අධිකරණ මණ්ඩලයේ තීරණය අනුව ක්‍රියාකිරීමට එක්සත් ජාතීන්ට අයත් හැම රටක් ම බැඳී ඇත්තේය.

2. නඩුවකට සම්බන්ධ වූ යම්කිසි පාර්ශ්වයක් අධිකරණ මණ්ඩලයෙන් දුන් තීන්දුවක් යටතෙහි ඒ පාර්ශ්වය කෙරෙහි පැවරී ඇති යුතුකම ඉෂ්ට කිරීම පැහැර හැරියොත් අනික් පාර්ශ්වයට ආරක්ෂක මණ්ඩලයේ පිළිසරණ සෙවිය හැකිය. ආරක්ෂක සභාවට සුදුසුයැයි හැඟුණොත් ඒ ඒ තීන්දුව ක්‍රියාත්මක කිරීම සඳහා යම් යම් නිර්දේශයන් කිරීමට හෝ අසවල් දේ කළ යුතුය කියා තීරණය කිරීමට හෝ ආරක්ෂක මණ්ඩලයට බලය ඇත්තේය.

**95 වැනි වගන්තිය**

දැනට වලංගුව තිබෙන්නා වූ හෝ මතුවට ඇති කරගන්නා වූ හෝ ගිවිසුම්වල ප්‍රකාරයට එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල තම තමන්ගේ මතභේද වෙනත් අධිකරණ සභා මගින් නිරාකරණය කර ගැනීමට බාධාවක් මේ ප්‍රඥප්තියේ සඳහන් කිසිවකින් ඇති නොවිය යුතුය.

**96 වැනි වගන්තිය**

1. ඕනෑම නීති ප්‍රශ්නයක් පිළිබඳව උපදේශයක් දෙන ලෙස ජාත්‍යන්තර අධිකරණ මණ්ඩලයෙන් ඉල්ලා සිටීමට මහා මණ්ඩලයට හෝ ආරක්ෂක මණ්ඩලයට හෝ පුළුවන.

2. ස්වකීය විෂය මාලාවට ඇතුළත් වන කරුණු සම්බන්ධයෙන් පැන නගින නීති ප්‍රශ්න පිළිබඳ උපදේශ, ජාත්‍යන්තර අධිකරණ මණ්ඩලයෙන් ලබාගත යුතු බවට කවර විටෙකදී වුවත් මහා මණ්ඩලයෙන් බලය දෙනු ලැබේ. එක්සත් ජාතීන්ගේ වෙනත් සංස්ථාවලටත් විශේෂිත ආයතනවලටත් ඒ නීති ප්‍රශ්න පිළිබඳ උපදේශ දෙන ලෙස ජාත්‍යන්තර අධිකරණ මණ්ඩලයෙන් ඉල්ලා සිටින්නට පුළුවන.

## XV වැනි පරිච්ඡේදය

# ලේකම් කාර්යාංශය

### 97 වැනි වගන්තිය

ලේකම් කාර්යාංශය මහා ලේකම්වරයකුගෙන් හා සංවිධානයට අවශ්‍ය වන කාර්ය මණ්ඩලයකින් ද සමන්විත විය යුතුය. ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ පිට මහා මණ්ඩලය විසින් මහා ලේකම්වරයා පත් කළ යුතුය. සංවිධානයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විය යුත්තේ ඔහුය.

### 98 වැනි වගන්තිය

මහා ලේකම් තැන, මහා මණ්ඩලයේ ද, ආරක්ෂක මණ්ඩලයේ ද, ආර්ථික හා සමාජ මණ්ඩලයේ ද, භාරකාරත්ව මණ්ඩලයේ ද මහ ලේකම් වශයෙන් ක්‍රියා කළ යුතුය. මෙම සංස්ථාවන් මගින් තමාට භාර කරනු ලබන වෙනත් කටයුතු ද ඔහු විසින් ඉෂ්ට කළ යුතුය. මහා ලේකම් විසින් සංවිධානයේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

### 99 වැනි වගන්තිය

තමාගේ කල්පනාවේ හැටියට ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමට තර්ජනයක් වශයෙන් පවතින ඕනෑම කරුණක් ගැන ආරක්ෂක මණ්ඩලයේ අවධානය යොමු කරවීමට මහා ලේකම්ට බලය ඇත්තේය.

### 100 වැනි වගන්තිය

1. ස්වකීය රාජකාරි ඉෂ්ට කිරීමේ දී මහා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය හැර වෙන කිසිම ආණ්ඩුවකින් හෝ වෙනයම් බල මණ්ඩලයකින් හෝ උපදෙස් ඉල්ලීම හෝ ලබා ගැනීම හෝ නොකළ යුතුය. සංවිධානයට පමණක් වගකියන ජාත්‍යන්තර නිලධරයන් වශයෙන් ස්වකීය තත්ත්වයට අපකීර්තියක් ගෙන දිය හැකි මොනම කටයුත්තක්වත් කිරීමෙන් වැළකී සිටිය යුතුය.

2. මහා ලේකම්ගේ හා කාර්ය මණ්ඩලයේ වගකීම්වල හුදු ජාත්‍යන්තර ස්වභාවය ගැන සලකා ඔවුන්ගේ ඒ වගකීම් ඉෂ්ට කිරීමේ දී ඔවුන්ට කිසිම බලපෑමක් නොකිරීමට එක්සත් ජාතීන්ගේ සෑම සාමාජිකයාම වගබලාගත යුතු වන්නේය.

**101 වැනි වගන්තිය**

1. මහා මණ්ඩලයෙන් සංස්ථාපිත රෙගුලාසි යටතේ මහා ලේකම් විසින් කාර්ය මණ්ඩලය පත්කළ යුතුය.

2. ආර්ථික හා සමාජ මණ්ඩලයට හා භාරකාරත්ව මණ්ඩලයට ස්ථිර වශයෙන් ම ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වෙනත් සංස්ථාවලට අවශ්‍යතාවයේ හැටි හැටියට ද සුදුසු කාර්ය මණ්ඩල පත්කළ යුතුය. කාර්ය මණ්ඩල ලේකම් කාර්යාංශයේ කොටසක් විය යුතුය.

3. කාර්ය මණ්ඩල පත්කර ගැනීමේදීත් සේවා කොන්දේසි තීරණය කිරීමේදීත් කාර්යක්ෂමතාව, ප්‍රවීණත්වය හා අවංකභාවය අතින් උසස් ම තත්ත්වයේ සේවකයන් ලබාගැනීම අවශ්‍ය බව ප්‍රධාන වශයෙන් ම සැළකිය යුතුය. හැකිතාක් දුරට ලෝකයේ නොයෙකුත් රටවලින් සේවකයන් බඳවා ගැනීමේ වැදගත්කම ගැන ද ප්‍රමාණවත් සැළකිල්ලක් දැක්විය යුතුය.

# XVI වැනි පරිච්ඡේදය

## විවිධ විධිවිධාන

### 102 වැනි වගන්තිය

1. මේ ප්‍රඥප්තිය වලංගු වුවාට පසුව එක්සත් ජාතීන්ගේ යම් සාමාජික රටක් ඇති කරගන්නා සියලුම ගිවිසුම් හා ජාත්‍යන්තර පොරොන්දු හැකිතාක් ඉක්මනින් ලේකම් කාර්යාංශයෙහි ලියාපදිංචිකොට ප්‍රකාශයට පමුණුවාලිය යුතුය.

2. මේ වගන්තියේ 1 වැනි ඡේදයේ විධිවිධාන අනුව ලියාපදිංචි නොකළා වූ එබඳු යම් ගිවිසුමකට එක්සත් ජාතීන්ට අයත් කිසිම සංස්ථාවක් ඉදිරියෙහි ඒ ගිවිසුම හෝ පොරොන්දුව් යටතේ ආධාර ඉල්ලීමට බලය නැත්තේය.

### 103 වැනි වගන්තිය

මේ ප්‍රඥප්තිය යටතේ එක්සත් ජාතීන්ගේ සාමාජිකයන් කෙරෙහි ඇති බැඳීම් හා වෙනයම් ජාත්‍යන්තර පොරොන්දුවක් යටතේ ඔවුන් කෙරෙහි ඇති බැඳීම් අතර පරස්පර විරෝධයක් ඇති වුවහොත් එහිදී බලපැවැත්විය යුත්තේ මේ ප්‍රඥප්තිය යටතේ ඔවුන් කෙරෙහි ඇති බැඳීම්ය.

### 104 වැනි වගන්තිය

හැම සාමාජිකයාගේ ම රාජ්‍යයක් ඇතුළත ස්වකීය කර්තව්‍යයන් ඉෂ්ට කිරීමත් පරමාධ්‍යාශයන් මුදුන් පමුණුවා ගැනීමත් සඳහා අවශ්‍ය වන නීතිබලය සංවිධානයට තිබිය යුතුය.

### 105 වැනි වගන්තිය

1. හැම සාමාජික රාජ්‍යයක් ඇතුළත, ස්වකීය පරමාධ්‍යාශයන් මුදුන් පමුණුවාලීම සඳහා අවශ්‍ය වන වරප්‍රසාද හා මුක්තීන් සංවිධානයට තිබිය යුතුය.

2. එමෙන් ම සංවිධානය සම්බන්ධයෙන් ස්වකීය කටයුතු ස්වෛරීව ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය වන වරප්‍රසාද හා මුක්තීන් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල නියෝජිතයන්ට හා සංවිධානයේ නිලධරයන්ට ද තිබිය යුතුය.

3. මේ වගන්තියේ 1 වැනි, 2 වැනි ඡේද අදාළ කර ගැනීම සම්බන්ධයෙන් විස්තර නිශ්චය කිරීම පිණිස නිර්දේශ කිරීමට හෝ මේ සඳහා එක්සත් ජාතීන්ගේ සාමාජික රටවලට ගිවිසුම් යෝජනා කිරීමට හෝ මහා මණ්ඩලයට බලය ඇත්තේය.

# XVII වැනි පරිච්ඡේදය

## සංක්‍රමණාත්මක ආරක්ෂක විධිවිධාන

### 106 වැනි වගන්තිය

ආරක්ෂක මණ්ඩලයේ කල්පනාවේ හැටියට 42 වැනි වගන්තිය යටතෙහි ස්වකීය වගකීම් ක්‍රියාත්මක කිරීමට පටන් ගැනීමට ආරක්ෂක මණ්ඩලයට පුළුවන්කම ලැබෙන 43 වැනි වගන්තියේ සඳහන් විශේෂ ගිවිසුම් වලංගු කර ගන්නාතුරු ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා සංවිධානය වෙනුවෙන් එකමුතුව වුවමනා වන ක්‍රියාවක් කිරීම සඳහා මොස්කව් නගරයේ දී 1943 ඔක්තෝබර් මස 30 වැනි දින සිව් මහා ජාතික ප්‍රකාශනයට අත්සන් කළ රාජ්‍යයන් හා ප්‍රංශ රාජ්‍යය විසින් ඒ ප්‍රකාශයේ 5 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඔවුනොවුන් සමගත් ප්‍රස්ථාවයේ හැටියට එක්සත් ජාතීන්ගේ වෙනත් සාමාජික රටවල් සමගත් සාකච්ඡා කළ යුතුය.

### 107 වැනි වගන්තිය

මේ ප්‍රඥප්තියට අත්සන් කරන යම්කිසි රටකට දෙවැනි ලෝක සංග්‍රාමය පැවැති සමයේ දී, සතුරුව සිටියා වූ යම් රාජ්‍යයන් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා ඒ යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් වගකීමක් තිබෙන්නා වූ ආණ්ඩු මගින් ගන්නා ලද නොහොත් අනුමත කරන ලද ක්‍රියාමාර්ගයක් අවලංගු කිරීමට හෝ අත්හැර දැමීමට හෝ මේ ප්‍රඥප්තියේ සඳහන් කිසිවක් සාධක නොවිය යුතුය.

# XVIII වැනි පරිච්ඡේදය

## සංශෝධන

**108 වැනි වගන්තිය**

මේ ප්‍රඥප්තිය පිළිබඳව කෙරෙන සංශෝධන එක්සත් ජාතීන්ගේ සියලුම රටවල් වෙනුවෙන් වලංගු විය යුත්තේ මහා මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකොටසකගේ ඡන්දයෙන් පිළිගනු ලැබ ආරක්ෂක මණ්ඩලයේ සියලුම ස්ථිර සාමාජිකයන් ද ඇතුළුව එක්සත් ජාතීන්ගේ සාමාජික රටවලින් තුනෙන් දෙකොටසක් විසින් ඒ ඒ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනුව සංශෝධන ස්ථිර කර ගත්තාට පසුවය.

**109 වැනි වගන්තිය**

1. මහා මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකොටසකගේ ඡන්දයෙන් හා ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් ඕනෑම නව දෙනකුගේ ඡන්දයෙන් ද නියම කරගනු ලබන දිනයක දී හා ස්ථානයක දී මේ ප්‍රඥප්තිය සමාලෝචනය කිරීම පිණිස එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල මහා සම්මේලනයක් පැවැත්විය හැකිය. මේ සම්මේලනයේ දී එක්සත් ජාතීන්ගේ එක් එක් සාමාජික රටට තිබිය යුත්තේ එක් ඡන්දයක් පමණකි.

2. මේ සම්මේලනයේ දී සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකොටසකගේ ඡන්දයෙන් මේ ප්‍රඥප්තිය පිළිබඳව නිර්දේශ කරනු ලබන ඕනෑම වෙනස් කිරීමක් වලංගු විය යුත්තේ ආරක්ෂක මණ්ඩලයේ සියලුම ස්ථිර සාමාජිකයන් ද ඇතුළුව එක්සත් ජාතීන්ගේ සාමාජික රටවලින් තුනෙන් දෙකොටසක් විසින් ඒ ඒ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනුව ඒ සංශෝධනය ස්ථිර කර ගත්තාට පසුවය.

3. මේ ප්‍රඥප්තිය වලංගුවීමෙන් අනතුරුව මහා මණ්ඩලයේ දස වැනි සාංවත්සරික සභා වාරයට කලින් එබඳු සම්මේලනයක් නොපවත්වන ලද්දේ නම් මහා මණ්ඩලයේ දස වැනි රැස්වීම් වාරයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කොට මහා මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් වැඩි ඡන්දයෙන් හා ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් ඕනෑම හත්දෙනකුගේ ඡන්දයෙන් ද ඒ යෝජනාව සම්මත කර ගනු ලැබුවහොත් ඒ සම්මේලනය පැවැත්විය යුතුය.

## XIX වැනි පරිච්ඡේදය

# ස්ථිර කර ගැනීම හා අත්සන් කිරීම

### 110 වැනි වගන්තිය

1. මේ ප්‍රඥප්තියට අත්සන් කරන රාජ්‍යයන් විසින් තම තමන්ගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනුව මේ ප්‍රඥප්තිය ස්ථිර කරගත යුතුය.

2. මෙසේ ස්ථිර කර ගන්නා ලද බවට එවන නිවේදන ඇමෙරිකා එක්සත් ජනපද ආණ්ඩුව වෙත තැන්පත් කළ යුතුය. එක් එක් රාජ්‍යය මගින් යථොක්ත නිවේදන තැන්පත් කරනු ලැබූවිට ඒ බව මේ ප්‍රඥප්තියට අත්සන් කළා වූ සියලුම රාජ්‍යවලට මෙන් ම සංවිධානයේ මහා ලේකම් පත් කළ විට ඔහුටත් යටකී ආණ්ඩුව විසින් දැනුම් දිය යුතුය.

3. චීන සමූහාණ්ඩුව, ප්‍රංශය, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය, මහා බ්‍රිතාන්‍යයේ හා උතුරු අයර්ලන්තයේ එක්සත් රාජධානිය, අමෙරිකා එක්සත් ජනපදය යන මේ රාජ්‍යයන් විසිනුත් මේ ප්‍රඥප්තියට අත්සන් කරන අවශේෂ සාමාජික රටවලින් වැඩි හරියක් විසිනුත් මේ ප්‍රඥප්තිය ස්ථිර කර ගන්නා ලද බවට එවන නිවේදන තැන්පත් කරනු ලැබූ විට මේ ප්‍රඥප්තිය වලංගු විය යුතුය. තදනන්තරව ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුව විසින් එසේ තැන්පත් කරන ලද යථෝක්ත නිවේදන පිළිබඳ ලේඛනයක් සම්පාදනය කොට එහි පිටපත් මේ ප්‍රඥප්තියට අත්සන් කළා වූ සියලුම සාමාජික රටවලට යැවිය යුතුය.

4. මේ ප්‍රඥප්තිය වලංගු වූවාට පසු ප්‍රඥප්තිය ස්ථිර කරන්නාවූ අත්සන් කළ රටවල් එක්සත් ජාතීන්ගේ මුල් සාමාජිකයන් වන්නේ ඒ ඒ රටවල් මගින් මේ ප්‍රඥප්තිය ස්ථිර කර ගත් බව දන්වා එවන නිවේදන එසේ තැන්පත් කළ දිනයේ දීය.

### 111 වැනි වගන්තිය

මේ ප්‍රඥප්තිය අමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය ආණ්ඩුවේ ලේඛනාගාරයෙහි සුරක්ෂිතව තැන්පත් කර තැබිය යුතුයි. මෙහි චීන, ප්‍රංශ, රුසියා, ඉංග්‍රීසි හා ස්පාඤ්ඤ පරිවර්තන ද මේ ප්‍රඥප්තිය මෙන් ම බල සහිත වන්නේය. විධි වූ ප්‍රකාර සහතික කරන ලද මේ පරිවර්තනවල පිටපත් ඒ ආණ්ඩුව විසින් මීට අත්සන් කළ සෙසු ආණ්ඩුවලට යැවිය යුතුය.

මීට සාක්ෂි වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආණ්ඩුවල නියෝජිතයින් විසින් මේ ප්‍රඥප්තිය වර්ෂ එක්දහස් නවසිය හතලිස් පහක් වූ ජූනි මස විසිහය වැනි දින සැන් ප්‍රැන්සිස්කෝ නගරයේ දී අත්සන් කරන ලදී.

එක්සත් ජාතීන්ගේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කොළඹ එක්සත් ජාතීන්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය විසින් පරිවර්තනය
කොට ප්‍රකාශයට පත් කැරිණ.

(නොමිලයේ බෙදාහැරීම සඳහා පමණි)

සිඑම්4361-3,000 (2004/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව